# වාර්ෂික කාර්ය සාධන වාර්තාව
# வருடாந்த செயற்பாட்டு அறிக்கை
# ANNUAL PERFORMANCE REPORT
# 2023



## දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, මුලතිව්
## மாவட்ட செயலகம், முல்லைத்தீவு
## DISTRICT SECRETARIAT, MULLAITIVU

# 2023 වර්ෂය සඳහා වන වාර්ෂික කාර්ය සාධන වාර්තාව

## ආයතනයේ නම - දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, මුලතිව්

## වැය ශීර්ෂ අංකය - 267

<u>අන්තර්ගතය</u> <u>පිටු අංකය</u>


| | | |
|---|---|---|
| පරිච්ඡේදය 01 - | ආයතනික පැතිකඩ / විධායක සාරාංශය | 01 |
| පරිච්ඡේදය 02 - | ප්‍රගතිය හා ඉදිරි දැක්ම | 13 |
| පරිච්ඡේදය 03 - | වර්ෂය සඳහා වන සමස්ත මූල්‍ය කාර්ය සාධනය | 15 |
| පරිච්ඡේදය 04 - | කාර්ය සාධන දර්ශක | 49 |
| පරිච්ඡේදය 05 - | තිරසාර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය | 50 |
| පරිච්ඡේදය 06 - | මානව සම්පත් පැතිකඩ | 52 |
| පරිච්ඡේදය 07 - | අනුකූලතා වාර්තාව | 58 |

## 01 වන පරිච්ඡේදය

### ආයතනික පැතිකඩ / විධායක සාරාංශය

### දිස්ත්‍රික් ලේකම් / දිසාපතිවරයාගේ පණිවිඩය



මුලතිව් දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2023 වර්ෂයට අදාල වාර්ෂික කාර්ය සාධන වාර්තාව සහ ගිණුම් ඉදිරිපත් කිරීමට ලැබීම පිළිබඳව මා බෙහෙවින් සතුටට පත්වෙමි. දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ප්‍රාදේශීය ලේකම් කාර්යාල, රේඛීය අමාත්‍යංශ සහ දෙපාර්තමේන්තු ඔස්සේ ක්‍රියාත්මක කරන ලද වැඩසටහන්, ව්‍යාපෘති සහ ක්‍රියාකාරකම් මෙම වාර්තාවට ඇතුළත් කර ඇත.

“අලුත් ගමක් - අලුත් රටක්” වැඩසටහන යටතේ 2023 වර්ෂය තුළ 1) ආර්ථික සංවර්ධනය අරමුණු කර ගනිමින් කුඩා සහ මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් බිහි කිරීම, කෘෂි නිෂ්පාදන සඳහා අපනයන වෙළඳපල අවස්ථා වැඩි කිරීම, 2) සමාජීය සංවර්ධනය ඉලක්ක කර ගනිමින් පාසැල් යා යුතු වයසේ පසුවන එහෙත් පාසැල් නොයන දරුවන් පාසැල්වලට ඇතුළත් කිරීම, මත් උවදුරට ඇබ්බැහිවූවන් ඉන් මුදවා ගැනීම, 3) දරිද්‍රතාවය දුරලීම යටතේ ආර්ථික වශයෙන් බලපෑමට ලක් වූ පවුල් ආර්ථික වශයෙන් ඉහළ නැංවීම, 4) සෞඛ්‍යය සහ පෝෂණය වැඩසටහන යටතේ අඩු ආදායම්ලාභී ගැබිණි මව්වරුන් පෝෂණ ආහාර පිරිනැමීම, පෝෂණය අඩු දරුවන්ගේ පෝෂණ මට්ටම වර්ධනය කිරීම උදෙසා පෝෂණ ආහාර පිරිනැමීම, 5) කෘෂිකර්මාන්තය නඟා සිටුවීමේ වැඩසටහන යටතේ ගෙවතු වගා වැඩිදියුණු කිරීම, 6) පරිසරය ආරක්ෂා කිරීමේ වැඩසටහන යටතේ පාරිසරික සමතුලිතතාවය වැඩිදියුණු කිරීමේ අරමුණින් වන සංරක්ෂණ ක්‍රියාකාරකම් පුළුල් කිරීම, 7) රාජ්‍ය ආදායම වර්ධනය කිරීම සහ 8) රාජ්‍ය වියදම් පාලනය කිරීම යන ශීර්ෂයන් අටක් යටතේ මෙම වැඩසටහන ක්‍රියාවට නංවා ඇත. මෙම “අලුත් ගමක් - අලුත් රටක්” නමැති වැඩසටහනින් 2023 වර්ෂයේ දී සමස්තයක් ලෙස 78% ක ඉලක්කයක් මුලතිව් දිස්ත්‍රික්කය තුළ සම්පූර්ණ කර ඇති අතර ආර්ථික වැඩසටහන 100% ක ඉලක්කයක් සම්පූර්ණ කර ඇත. එමෙන්ම දරිද්‍රතාව දුරලීමේ වැඩසටහන 176% ක ඉලක්කයක් ද, පාරිසරික වැඩසටහන 185% ක ඉලක්කයක් ද, රාජ්‍ය ආදායම වර්ධනය කිරීමේ වැඩසටහන 93% ක ඉලක්කයක් ද 2023 වර්ෂයේ දී සපුරාගෙන ඇත. ඒ අනුව මෙම වැඩසටහන තවදුරටත් සාර්ථකව ක්‍රියාත්මක කෙරෙමින් පවතී.

2023 වර්ෂයට අදාලව වී අස්වනු මිල දී ගැනීමේ වැඩසටහන යටතේ සමස්ථ ප්‍රතිපාදන ලෙස රුපියල් මිලියන 419 ක් හිමි වූ අතර එයින් රුපියල් මිලියන 388 ක් උපයෝජනය කර ඇත. මෙම වැඩසටහන ඔස්සේ වී මෙට්‍රික් ටොන් 3437 ක් මුලතිව් දිස්ත්‍රික්කයේ ගොවීන්ගෙන් මිල දී ගන්නා ලදුව සහල් මෙට්‍රික් ටොන් 2234 ක් පමණ නිෂ්පාදනය කර ඇත. මෙයින් සහල් මෙට්‍රික් ටොන් 660 ක් මුලතිව් දිස්ත්‍රික්කයේ පරිභෝජනය සඳහා වෙන්කර ඉතිරි සහල් මෙට්‍රික් ටොන් 1573 ක ප්‍රමාණය යාපනය දිස්ත්‍රික්කයේ පරිභෝජනය සඳහා බෙදා හරින ලදී.

මුලතිව් දිස්ත්‍රික්කයේ කෘෂිකාර්මික ක්ෂේත්‍රය ඉහළ නැංවීමේ අරමුණින් 2023 වර්ෂයේ දී එළු පාලනය දිරිමත් කරමින් රුපියල් මිලියන 13 ක් වැය කොට ප්‍රතිලාභීන් සඳහා එළුවන් ලබාදෙන ලද අතර උඳු සහ මුං වගාව සඳහා රුපියල් මිලියන 7.5 ක වටිනාකමින් යුත් බීජ ලබාදෙන ලදී. එමෙන්ම උඳු සහ මුං වගාව දිරිමත් කරමින් රුපියල් මිලියන 3.9 ක් වැය කරමින් කුඩා පරිමාණයේ කෘෂි යන්ත්‍රෝපකරණ ගොවීන්ට ලබාදෙන ලද අතර කෘෂිකර්මාන්ත අංශයේ නිෂ්පාදන ක්‍රියාකාරකම් කාර්යක්ෂමව ඉටුකිරීමට අවශ්‍ය පහසුකම් සැලසීමේ කටයුතු තවදුරටත් ක්‍රියාත්මක වෙමින් පවතී.

දැනට පවතින උද්ධමනය සහ ආර්ථික අර්බුදය හේතුවෙන් දරිද්‍රතා රේඛාවෙන් පහළ මට්ටමේ ජීවත් වන ජනතාවට මූලික අවශ්‍යතා ලබාදීමේ අරමුණින් 2023 වර්ෂහේ දී නිවාස 18 ක් ප්‍රතිලාභීන් වෙත හිමිකර දී ඇත. ඒ අතරින් නිවාස 9 ක් රුපියල් මිලියන 1 ක ප්‍රතිපාදන මත ද, නිවාස 9 ක් රුපියල් මිලියන 0.6 ක ප්‍රතිපාදන මත ද සාර්ථකව නිමා කරන ලදී.

හරිත විප්ලවය වැඩසටහන යටතේ ශාක පැලෑටි 5000 ක් සිටුවීමේ ව්‍යාපෘතිය 2023 වර්ෂයේ දී ආරම්භ කරන ලදුව දැනට ජයග්‍රාහී ලෙස ක්‍රියාත්මක වෙමින් පවතී. මෙමගින් මුලතිව් දිස්ත්‍රික්කය හරිත විප්ලවය සඳහා වන දිස්ත්‍රික්කයක් ලෙස මුල්තැන් ගැනීමට හැකියාව සැලසෙනු ඇත.

2023 වර්ෂයේ දී වෙරළ තීරය පිරිසිදු කිරීමේ සහ පවත්වාගෙන යාමේ තේමාව යටතේ වෙරළ තීරයේ චක්‍රීය ලෙස ශ්‍රමදාන වැඩසටහන් ක්‍රියාත්මක කර පාරිසරික සංරක්ෂණයට කටයුතු කර ඇති අතරම වෙරළ තීරය පිරිසිදුව පවත්වාගෙන යාම මූලික අරමුණ කර ගනිමින් මෙම වැඩපිළිවෙල තවදුරටත් ක්‍රියාවට නංවා ඇත. මෙමගින් වෙරළ තීරය සංචාරකයින්ගේ ප්‍රමුඛ ආකර්ශණයක් බවට පත්වෙමින් තිබේ.

සමෘද්ධි බැංකු මගින් 2023 වර්ෂයේ දී රු. 154,620 ක මුදලක් ඉතුරුම් තැන්පතු ලෙසත්, රු. 645,645,212.00 ක මුදලක් ස්ථාවර තැන්පතු ලෙසත් ලබාගෙන ඇති අතර 2023 වර්ෂයේ ආරම්භයේ සිට අන්තර්ජාල බැංකු සේවා මුලතිව් දිස්ත්‍රික්කයේ සෑම බැංකු ශාඛාවකම හඳුන්වා දී සාර්ථකව ක්‍රියාත්මක වෙමින් පවතී. සමෘද්ධි අංශය උසස් ලෙස ක්‍රියාත්මක වීමට සහ ජයග්‍රහණයන්ට දායක වූ සහ උපකාරී කළ සැම දෙනා වෙතම අපගේ ස්තූතිය ප්‍රකාශ කර සිටිමි.

2023 වර්ෂයේ දී අපගේ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයීය වැය ශීර්ෂයේ වාර්ෂික ප්‍රතිපාදන ලෙස රුපියල් මිලියන 1870 ක මුදලක් වෙන්කර තිබූ අතර ඉන් රුපියල් මිලියන 1781 ක මුදලක් උපයෝජනය කොට ඇත. මේ සඳහා විශේෂ උපදෙස් ලබාදෙමින් මඟපෙන්වීම් සහ අනෙකුත් උපකාර සිදුකළ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය, අනෙකුත් රේඛීය අමාත්‍යාංශයන්, මහා භාණ්ඩාගාරය සහ දෙපාර්තමේන්තු සියල්ල වෙත ස්තූතිය පල කිරීමට කැමැත්තෙමි.

අප දිස්ත්‍රික්කය තුළ පදිංචි ජනතාව වෙනුවෙන් වඩාත් ප්‍රයෝජනවත් ලෙස දැඩි කැපවීමෙන් සපිරිව සේවාවන් සැලසීමට කටයුතු කළ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ විධායක ශ්‍රේණියේ

නිලධාරීන්, ප්‍රාදේශීය ලේකම්වරුන් මෙන්ම දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයන්හි සේවයේ නිරත සමස්ත කාර්යය මණ්ඩලය වෙත මාගේ හෘදයාංගම කෘතඥතාවය පල කර සිටිමි.

අ. උමාමහේෂ්වරන්
දිස්ත්‍රික් ලේකම් / දිසාපති
දිස්ත්‍රික් ලේකම් කාර්යාලය
මුලතිව්

A.Umamaheswaran,
District Secretary/Government Agent,
District Secretariat,
Mullaitivu.

## 1.1 මුලතිව් දිස්ත්‍රික්කය පිළිබඳව හැඳින්වීම

### 1.1.1 මුලතිව් දිස්ත්‍රික්කයේ පිහිටීම සහ වපසරිය :-

මුලතිව් දිස්ත්‍රික්කය ශ්‍රී ලංකාවේ අළුතින් පිහිටුවන ලද පරිපාලන දිස්ත්‍රික්ක අතරින් එකකි. 1979 වර්ෂයේ දී බිහි වූ එය කිළිනොච්චි, මන්නාරම, ත්‍රිකුණාමලය සහ වවුනියා දිස්ත්‍රික්කයන්ගෙන් සහ එක් දිශාවකින් සාගරයෙන්ද වටවී ඇති ප්‍රදේශයකි.

මෙම දිස්ත්‍රික්කය උතුරු පළාතේ ප්‍රධාන භූමියේ නැගෙනහිර කොටසෙහි පිහිටා ඇත. මුලතිව් දිස්ත්‍රික්කය උතුරු දිශාවෙන් කිළිනොච්චි දිස්ත්‍රික්කයෙන් මායිම් වන අතර දකුණු දිශාවෙන් ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය, වවුනියා දිස්ත්‍රික්කය හා මන්නාරම දිස්ත්‍රික්කයේ කොටසකින් ද, බටහිර දිශාවෙන් මන්නාරම දිස්ත්‍රික්කයෙන් සහ නැගෙනහිර දිශාවෙන් මුහුදෙන් ද මායිම් වේ. මෙම දිස්ත්‍රික්කය ආසන්න වශයෙන් වර්ග කිලෝමීටර් 2516.9 ක භූමි ප්‍රමාණයක් ආවරණය කරයි. (වනාන්තර ප්‍රදේශ ඇතුලත් වන අතර විශාල අභ්‍යන්තර ජලාශ ඇතුළත් කර නොමැත). එය දිවයිනේ සමස්ත භූමි ප්‍රමාණයෙන් 3.8 % ක ප්‍රමාණයක් වේ.

### 1.1.2 දේශගුණ සහ භෞතික ලක්ෂණයන්

**දේශගුණය :-**

වියලි කලාපය - ද්විමාන වර්ෂාපතන රටාව. සාමාන්‍ය වාර්ෂික වර්ෂාපතනය මි.මී. 1300 සිට මි.මී. 2416 දක්වා පරාසයක විහිදේ. උෂ්ණත්වය සෙල්සියස් අංශක 23.0 සිට සෙල්සියස් අංශක 39.30 දක්වා පරාසයක විහිදේ.

**භෞතික ලක්ෂණ :-**

මුලතිව් දිස්ත්‍රික්කය ප්‍රධාන වශයෙන්ම තැනිතලා භූමියකින් සමන්විත වේ. සාමාන්‍යයෙන් නැගෙනහිර සහ උතුරු දෙසට බෑවුම් වීම සහ එහි බටහිර කොටස බටහිර සහ දකුණු දෙසට බෑවුම් වීම මුලතිව් දිස්ත්‍රික්කයේ භෞතික ලක්ෂණයන් වේ. මෙම දිස්ත්‍රික්කය කිලෝමීටර 70 ක දිගින් යුත් වෙරළ තීරයකින් සමන්විත වන අතර කෝකිලායි, නයාරු, නන්දිකඩල් සහ මාතලන් යන ඉස්සන් වගාවට වඩාත් හිතකර කලපු සතරකින්ද සමන්විත වේ. භූමියෙහි උස මුහුදු මට්ටමේ සිට මීටර් 36.5 ක් දක්වා වන පරාසයක විහිදේ. වගාවන් සඳහා හිතකර රතු දුඹු පස සහ රතු කහ ලැක්ටෝ පස ප්‍රධාන පාංශු කාණ්ඩයන් වේ.

**ඉඩම් පරිහරණය :-**

මෙම දිස්ත්‍රික්කය වනාන්තර, මුඩු බිම්, පොල් වතු, කෘෂිකාර්මික ඉඩම් සහ ජලාශ ආදී විවිධ පාරිසරික පද්ධතීන්ගෙන් සමන්විත වන අතර මුළු භූමි ප්‍රමාණය හෙක්ටයාර 251,690 ක් වේ. එය විවිධාකාර ආර්ථික සම්පත්වලින් සමන්විතය. මුළු භූමි ප්‍රමාණයෙන් හෙක්ටයාර 167,850 ක් හෙවත් 64.1% ක් වනාන්තරවලින් සමන්විත වේ. ජලාශ සහ වගුරු බිම් ප්‍රමාණය හෙක්ටයාර

21,390 ක් හෙවත් සමස්ත භූමි ප්‍රමාණයෙන් 8.5% ක් ද, කෘෂිකාර්මික ඉඩම් ප්‍රමාණය හෙක්ටයාර 44,040 ක් හෙවත් සමස්ත භූමි ප්‍රමාණයෙන් 16.9% ක් ද වේ. මීට අමතරව ජනාවාස සහ ගොඩනැගිලිවලින්ද සමන්විත වේ.

### 1.1.3 දිස්ත්‍රික්කයේ ආර්ථික තත්වයන් සහ ජනතාවගේ ජීවන රටාවන්

ජනතාවගෙන් බහුතරයක් කෘෂිකාර්මික කටයුතුවල නිරතව සිටී. තවද ධීවර කර්මාන්තය සහ සත්ව පාලනය, ස්වයං රැකියා ක්‍රියාකාරකම් සහ රාජ්‍ය අංශයේ සහ පුද්ගලික ආයතනයන්හි රැකියා ආදිය ද ඇතුලත් වේ.

**ආර්ථිකය ක්‍රම**

දිස්ත්‍රික්කයේ ආර්ථිකය ප්‍රධාන වශයෙන්ම කෘෂිකර්මාන්තය සහ ධීවර කර්මාන්තය මත රඳා පවතී. ඊට අමතරව දිස්ත්‍රික්කයේ ආර්ථික ක්‍රියාකාරකම් ලෙස සත්ව පාලනය සහ වනාන්තර ආශ්‍රිත කටයුතු ද සිදු කෙරේ. ආසන්න වශයෙන් පවුල් 4850 ක් ධීවර කර්මාන්තයේ ද, පවුල් 23680 ක් කෘෂි කර්මාන්තයේ ද නිරතව සිටී.

**කෘෂිකර්මාන්තය**

කෘෂිකර්මාන්ත අංශය දිස්ත්‍රික්කයේ ප්‍රධානතම ආදායම් උත්පාදන මාර්ගය වේ. ගොවීන්ගෙන් 80% ක්ම යැපෙනුයේ මෙම අංශයෙනි. දිස්ත්‍රික්කය සතුව වී වගාව සඳහා යොදාගත හැකි ඉඩම් හෙක්ටයාර 25,730.77 ක් පවතී. ඒවායේ විස්තර පහත පරිදි වේ.

| | |
|---|---|
| විශාල | - හෙක්. 8,288.94 |
| මධ්‍යම | - හෙක්. 6,207.03 |
| කුඩා | - හෙක්. 11,234.80 |

විශාල වැව් 03 ක් සහ මධ්‍ය ප්‍රමාණයේ වැව් 17 ක් මඟින් දිස්ත්‍රික්කයේ විශාල කුඹුරු හෙක්ටයාර 7993.9 ක් පෝෂණය කරන අතර, කුඩා වැව් 228 ක් මඟින් දිස්ත්‍රික්කයේ විශාල කුඹුරු හෙක්ටයාර 4337.5 ක් පෝෂණය කරයි.

**ධීවර කර්මාන්තය**

මෙම දිස්ත්‍රික්කය කිලෝමීටර 70 ක දිගින් යුත් වෙරළ තීරයකින් යුක්ත වන අතර මාතලන්, නන්දිකඩල්, නයාරු සහ කොක්කුලායි යන මත්ස්‍ය සම්පත් සංවර්ධනයට වඩාත් සුදුසු කලපු සතරකින්ද සමන්විත වේ. මෙම කලපු කකුළුවන් සහ ඉස්සන් වගාව සඳහා ප්‍රසිද්ධියක් උසුලයි. විශාල වැව්වල මිරිදිය ධීවර සම්පත් සංවර්ධනය සඳහා අවස්ථාවන් ඇත. මෙම දිස්ත්‍රික්කයේ සැලකිය යුතු පවුල් සංඛ්‍යාවකගේ ජීවනෝපාය මාර්ගය මෙය වන අතර ඔවුන්ගේ රැකියා අවස්ථා සහ ආදායම් මාර්ග වර්ධනය සඳහා විශාල මෙහෙයක් මෙමගින් ඉටු වේ.

### 1.1.4 දිස්ත්‍රික්කයේ ජල සම්පත්

මෙම දිස්ත්‍රික්කය සතුව කෘෂිකර්මාන්ත සංවර්ධනය සඳහා යොදා ගත හැකි ජල සම්පත් පවතී. නමුත් වාරිමාර්ග ආශ්‍රිතව කළ යුතු වගාවන් සඳහා ස්ථාවරව ගලායන ගංඟා කිසිවක් දක්නට නොමැත. විශාල වැව් 03 ක්, මධ්‍යම ප්‍රමාණයේ වැව් 17 ක් සහ කුඩා වැව් 228 ක් දිස්ත්‍රික්කය තුල පිහිටා තිබේ. කෘෂි කර්මාන්තය සඳහා ප්‍රධාන ජල මූලාශ්‍රය වනුයේ වර්ෂා ජලය යි.

### 1.1.5 දිස්ත්‍රික්කයේ මූලික තොරතුරු

**පරිපාලන** කොට්ඨාශ

පරිපාලනමය වශයෙන් මෙම දිස්ත්‍රික්කය වන්නි මැතිවරණ දිස්ත්‍රික්කයේ කොටසක් වශයෙන් පවතී. දිස්ත්‍රික්කයේ පරිපාලන කොට්ඨාශ හයක් පවතින අතර ග්‍රාම නිලධාරී කොට්ඨාශ 136 ක් සහ ගම්මාන 632 ක් ද පවතී.

| අංක | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය | ග්‍රා.නි. කොට්ඨාශ සංඛ්‍යාව | ගම්මාන සංඛ්‍යාව |
|---|---|---|---|
| 01 | මුහුදුබඩපත්තුව | 46 | 219 |
| 02 | පුදුකුඩිඉරුප්පු | 19 | 179 |
| 03 | ඔඩ්ඩුසුඩ්ඩාන් | 27 | 114 |
| 04 | තුනුක්කායි | 20 | 35 |
| 05 | මාන්තෙ නැගෙනහිර | 15 | 68 |
| 06 | වැලිඔය | 09 | 17 |
| **එකතුව** | | **136** | **632** |

**ජනගහනය**

1981 වර්ෂයේ ජන සංගණනයට අනුව මෙම දිස්ත්‍රික්කයේ ජනගහනය 77,515 ක් විය. දිවයිනේ පැවති අයහපත් වාතාවරණය හේතුවෙන් 1991 සහ 2001 වර්ෂයන්හිදී සංගණන කටයුතු සිදුව නොමැත. 2001 දෙසැම්බර් මාසයේ මෙම දිස්ත්‍රික්කයේ ජනගහනය 180,401 ක් වූ අතර එය දිවයිනේ සමස්ත ජනගහනයෙන් 1.07% කි.

2023-12-31 දින වන විට මෙම දිස්ත්‍රික්කයේ නැවත පදිංචි කළ ජනගහනය 140,931 කි. එහි විස්තර පහත පරිදි වේ.

| ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය | ජනගහනය | |
|---|---|---|
| | පවුල් සංඛ්‍යාව | සාමාජිකයින් සංඛ්‍යාව |
| මුහුදුබඩපත්තුව | 13,900 | 42,829 |
| පුදුකුඩිඉරුප්පු | 14,980 | 42,670 |
| ඔඩ්ඩුසුඩ්ඩාන් | 6,696 | 20,456 |
| තුනුක්කායි | 4,373 | 13,284 |
| මාන්තෙයි නැගෙනහිර | 3,266 | 10,066 |
| වැලිඔය | 4,240 | 11,626 |
| එකතුව | **47,455** | **140,931** |

**සෞඛ්‍යය**

මෙම දිස්ත්‍රික්කය තුල සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කොට්ඨාශ 06 ක්, දිස්ත්‍රික් මහ රෝහලක්, මූලික රෝහල් 03 ක්, ප්‍රාදේශීය රෝහල් 07 ක් ක්‍රියාත්මකව පවතී. ප්‍රාථමික වෛද්‍ය ඒකක 08 ක්, ග්‍රාමෝදය සෞඛ්‍ය මධ්‍යස්ථාන 38 ක්, මැලේරියා නිවාරණ සංයුක්ත ඒකකයක්, මානසික සෞඛ්‍ය ඒකකයක්, ලිංගාශ්‍රිත බෝවන රෝග සායනයක්, හෘද රෝග සායනයක් සහ ජලභීතිකා පාලන ඒකකයක් ද මුලතිව් දිස්ත්‍රික් ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරයා යටතේ ක්‍රියාත්මක වේ.

**අධ්‍යාපනය**

අධ්‍යාපන කලාප දෙකකි (මුලතිව් සහ තුනුක්කායි). දැනට ක්‍රියාත්මක ජාතික පාසල් 03 ක් ඇතුළුව පාසල් 129 (1ඒබී -14, 1සී - 16, II - 37, III - 62) ක ගුරුවරුන් 2,087 ක් සහිතව ශිෂ්‍යයන් 28,137 දෙනකු අධ්‍යාපන කටයුතුවල නිරතව සිටිති.

## 1.1.6 මූලික තොරතුරු දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - මුලතිව් දිස්ත්‍රික්කය

- පළාත : උතුරු
- දිස්ත්‍රික්කය : මුලතිව්
- මැතිවරණ කොට්ඨාශය : වන්නි
- මැතිවරණ කොට්ඨාශ අංකය : 11
- ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ : 06
    - මුහුදුබඩපත්තුව
    - පුදුකුඩිඉරුප්පු
    - ඔඩ්ඩුසුඩ්ඩාන්
    - තුනුක්කායි
    - මාන්තෙ නැගෙනහිර
    - වැලිඔය
- වැදගත් දුරකථන අංක : 021-229-0035, 021-229-0045
- ග්‍රාම නිලධාරී කොට්ඨාශ සංඛ්‍යාව : 136
- ගම්මාන සංඛ්‍යාව : 632
- ප්‍රාදේශීය සභා සංඛ්‍යාව : 04
- ප්‍රධාන නගරය : මුලතිව්
- සමස්ත භූමි ප්‍රමාණය : වර්ග කිලෝමීටර් 2693
- සමස්ත ජනගහනය (2023) : 140,931
- ජනඝණත්වය - වර්ග කිලෝමීටරයකට : 51.78
- මුළු පවුල් සංඛ්‍යාව : 47,455
- පාසල් සංඛ්‍යාව : 129
- සාමාන්‍ය වාර්ෂික උෂ්ණත්වය : 23.0 °C – 39.3 °C
- සාමාන්‍ය වාර්ෂික වර්ෂාපතනය : මි.මී. 1808

## 1.2 දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ දැක්ම, මෙහෙවර සහ අරමුණු

### දැක්ම

පරිසර හිතකාමී ප්‍රවේශයක් සහිතව තිරසාර රාජ්‍ය සේවාවන් ඉටුකර දීමේ වඩාත් ප්‍රමුඛ ආයතනයක් බවට පත්වීම.

### මෙහෙවර

රජයේ ප්‍රතිපත්ති රාමුවට අනුකූලව ඵලදායී යහපාලන ක්‍රියාවලියන් ඔස්සේ හා කාර්යක්ෂම ඵලදායි පරිපාලනය හා නිර්මාණශීලි සම්පත් කළමනාකරණය මඟින් ජන ජීවිත සවිබල ගැන්වීම තුලින් දිස්ත්‍රික්කය තිරසර සංවර්ධනයක් කරා ගෙනයන කාර්ය මණ්ඩලයකින් යුක්ත වීම.

### අරමුණු

01. කුඩා සහ මධ්‍ය පරිමාණයේ ආහාර නිෂ්පාදන දිරිගැන්වීම සඳහා කටයුතු කිරීම.
02. වත්මන් ආර්ථික පීඩනය සැලකිල්ලට ගෙන සෑම අංශයකම වියදම් පාලනය කිරීම.
03. දරිද්‍රතාවය තුරන් කිරීම තුලින් කුසගින්න දුරු කිරීම.
04. සෞඛ්‍ය සම්පන්න සමාජයක් ගොඩනැගීම.
05. අධ්‍යාපනයෙන් පරිපූර්ණ සමාජයක් ගොඩනැගීම.
06. 2023 වර්ෂයේ දී පාසැල් හැරගිය සිසුන් හඳුනාගෙන දැනුවත් කිරීම මඟින් අධ්‍යාපනයෙන් පරිපූර්ණ සමාජයක් ගොඩනැගීමට කටයුතු කිරීම.
07. 2023 වර්ෂයේ දී දිස්ත්‍රික්කයේ යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම.
08. මාර්ග සංවර්ධනය, විදුලිය, පානීය ජලය, ප්‍රවාහන, ඇල මාර්ග ඉදිකිරීම් වැනි යටිතල පහසුකම් සකස් කිරීම තුලින් දිස්ත්‍රික්කයේ යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම.
09. හරිත නිෂ්පාදන ආශ්‍රිත ක්‍රියාකාරකම් සංවර්ධනය .
10. පරිසරය ආරක්ෂා කරගන්නා අතරම එහි ඵලප්‍රයෝජන ලබාගැනීමටද හැකි අයුරින් ආයතනයේ කටයුතු හරිත නිෂ්පාදන ක්‍රියාකාරකම් තුලින් ක්‍රියාත්මක කිරීම.
11. රැකියා අවස්ථා ලබා දීම.
    2023 වර්ෂයේ දී රැකියා විරහිත අයවලුන් අතරින් 2% ක පිරිසක් සඳහා විවිධ අංශවල රැකියා ලබාගැනීම සඳහා අවස්ථා සලසා දීම.
12. කාන්තාවන්ට එරෙහි හිංසනයන්ගෙන් තොර, ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවයෙන් යුත්, මත්ද්‍රව්‍ය භාවිතයෙන් තොර, දරුවන්ට සහ වැඩිහිටියන්ට සැළකිලි දක්වන සමාජයක් ගොඩනැගීම.
13. කාන්තාවන්ට එරෙහි පැහැරගෙන යාම් සහ ලිංගික හිංසනයන් අවම කිරීම, කාන්තා ගෘහ මූලික පවුල් සවිබල ගැන්වීම සමඟ දරුවන්ගේ සහ වැඩිහිටියන්ගේ අයිතිවාසිකම් සහ ඔවුන්ගේ ආරක්ෂාව තහවුරු කිරීම.


14. නගර පිරිසිදු කිරීම, ශාක රෝපනය සහ නඩත්තු කිරීම, සංචාරක කර්මාන්තය වර්ධනය කිරීම.
15. පිරිසිදු ජල පහසුකම් සහ වැසිකිළි පහසුකම් සකස් කරදීම.
16. 2023 වර්ෂයේ දී 98% ක පිරිසක් සඳහා සෞඛ්‍යාරක්ෂිත වැසිකිළි පහසුකම් සකස් කරදීම සහ පානීය ජල පහසුකම් ලබාදීම.
17. වෙරළ තීරය පිරිසිදු කිරීම සහ ජලජ ජීවීන් ආරක්ෂා කිරීම.
18. පොලිතීන් භාවිතය අවම කිරීම සහ වෙරළාශ්‍රිතව දක්නට ලැබෙන ප්ලාස්ටික් ද්‍රව්‍ය අවශ්‍ය පරිදි ඉවත් කිරීම මඟින් ජලජ ජීවීන්ගේ පැවැත්ම තහවුරු කිරීම සහ වෙරළ තීරයේ පිරිසිදුතාවය වර්ධනය කිරීම.
19. පාරිසරික සම්පත්වල ආරක්ෂාව තහවුරු කිරීම සමඟ පරිසර හිතකාමී ජීවන රටාවක් පවත්වාගෙන යාම.
20. අනවසරයෙන් වනාන්තර එළිපෙහෙළි කිරීම් සහ අනවසරයෙන් වැලි ගොඩ දැමීම වැලැක්වීමට අවශ්‍ය පියවර ගැනීම.
21. දිස්ත්‍රික්කය සතු භෞතික සම්පත් සහ මානව සම්පත් කාර්යක්ෂම ලෙස උසස් මට්ටමෙන් භාවිතයට ගැනීම.
22. හිතකර සේවා පරිසරයක් ගොඩනැගීම
23. අභ්‍යන්තර සේවාලාභීන් දිරිමත් කිරීම සහ බාහිර සේවාලාභීන්හට පහසුවෙන් සේවාවන් ලබාගැනීමට අවශ්‍ය ක්‍රමවේදයන් සලසා දීම.
24. ක්‍රීඩා සහ සංස්කෘතික ක්‍රියාකාරකම් සඳහා මුල්තැන් දෙමින් තරුණයින් දිරිමත් කිරීම.
25. කෘෂි කර්මාන්තය, සුළු පරිමාණ ස්වයං රැකියා සහ ධීවර කර්මාන්තය සංවර්ධනය කිරීම.

### 1.2.1 කරුණු සහ ක්‍රියාකාරකම්

01. පහත සේවාවන් සැපයීම තුලින් දිස්ත්‍රික් සහ ප්‍රාදේශීය පරිපාලනය උසස් මට්ටමකට ගෙන යෑම.
    - සංවර්ධන කාර්යයන්ට අදාල ව්‍යාපෘතීන් ක්‍රියාත්මක කිරීම
    - මහජනතාව සඳහා යහපත් සේවාවක් ඉටුකිරීම
02. මූල්‍ය ප්‍රතිපාදනයන් කාර්යක්ෂම ලෙසත් දක්ෂ ලෙසත් භාවිතා කරමින් ස්ථාවර වත්කම් නිසි පරිදි පවත්වාගෙන යාම.
03. කාර්යක්ෂම ලෙස විශ්‍රාම වැටුප් ගෙවීම.
04. ආපදා කළමනාකරණ කටයුතු ඉටුකිරීම.
05. දිස්ත්‍රික්කයේ පුනරුත්ථාපන සහ ඉදිකිරීම් කටයුතු ක්‍රියාත්මක කිරීම.
06. දුගී ජනතාව සඳහා සහනාධාර ලබා දීම.
07. වෙරළ තීරයන්හි ආරක්ෂාව තහවුරු කිරීම සහ සාගර සම්පත් ආරක්ෂා කිරීම.
08. ස්වභාවික සම්පත් ආරක්ෂා කිරීම.

09. සමාජ සාධාරණත්වය සඳහා වන පියවරයන් ක්‍රියාවට නැංවීම.
10. සන්නිවේදන තාක්ෂණ ක්‍රමවේදයන් වර්ධනය කිරීම.
11. මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
12. ඉඩම් හිමිකම් ලබාදීමට අදාල කටයුතු.
13. සමාජ ආරක්ෂණය, සංස්කෘතික, සිරිත් විරිත් සම්බන්ධ  වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
14. සමෘද්ධි සංවර්ධන වැඩසටහන්.
15. මාර්ග නීති සහ රථවාහන ධාවන කටයුතු සවිමත් කිරීම.
16. මැතිවරණ දෙපාර්තමේන්තුවේ කටයුතු සහ ලියාපදිංචි කිරීම් කටයුතු.
17. ක්‍රීඩා අංශයේ සංවර්ධන කටයුතු.
18. කර්මාන්ත සංවර්ධනය සහ පුහුණුවීම්.
19. ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය තහවුරු කිරීම.
20. ළමා ආරක්ෂාව.
21. ආකල්ප වර්ධනය සහ දැනුම් කළමනාකරණය වර්ධනය කිරීම.

## 1.3 ආයතනයේ සංවිධාන සටහන



## 1.4 අමාත්‍යාංශය යටතේ ඇති දෙපාර්තමේන්තු / දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අංශයන් / දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ ඇති ප්‍රදේශීය ලේකම් කාර්යාල

1. මුහුදුබඩපත්තුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය
2. පුදුකුඩිඉරුප්පු ප්‍රාදේශීය ලේකම් කාර්යාලය
3. ඔඩ්ඩුසුඩ්ඩාන් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය
4. තුනුක්කායි ප්‍රාදේශීය ලේකම් කාර්යාලය
5. මාන්තෙ නැගෙනහිර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය
6. වැලිඔය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය

## 1.5 අමාත්‍යාංශය / දෙපාර්තමේන්තුව / පළාත් සභාව / පළාත් පාලන ආයතන යටතේ ඇති ආයතන / අරමුදල්

# 02 වන පරිච්ඡේදය

## 2.1 ප්‍රගතිය සහ ඉදිරි දැක්ම

**දිස්ත්‍රික් මට්ටමේ සාධනයන්**

1. සුභසාධන ප්‍රතිලාභ සභාව යටතේ දුගී පවුල් 16,211 ක් සුභසාධන ප්‍රතිලාභ ලබාදීම සඳහා තෝරාගෙන ඇත.
2. සැමට ආහාර යන අරමුණ ඉලක්ක කර ගනිමින් ගෙවතු 2144 ක් නිර්මාණය කර ඇත.
3. 2023 වර්ෂයේ දී කෘෂි නිෂ්පාදන අපනයනය දිරිගැන්වීමේ අරමුණින් ස්වයං රැකියා ව්‍යාපෘති 09 ක් සහ කුඩා සහ මධ්‍ය පරිමාණ ව්‍යාපෘති 40 ක් ආරම්භ කර ඇත.
4. නාගරික සංවර්ධන සහ නිවාස ඉදිකිරීම් අමාත්‍යාංශය යටතේ දුගී පවුල් 18 ක් සඳහා රු. 1,000,000 ක වියදමින් නිවාස 09 ක් ද රු. 600,000 ක වියදමින් නිවාස 09 ක් ද ඉදිකර දී ඇත.
5. කෘෂිකර්ම අමාත්‍යාංශය යටතේ පවුල් 168 ක් සඳහා ජීවනෝපාය මාර්ග ලෙස රු. මිලියන 12.76 ක වටිනාකමින් යුත් එළුවන් 504 දෙනකු ලබා දී ඇත.
6. ප්‍රධාන කෘෂි බෝග නිෂ්පාදනය වර්ධනය සඳහා රු මිලියන 7.329 ක වටිනාකමින් යුත් උඳු බීජ කිලෝග්‍රෑම් 2600 ක් සහ මුං බීජ කිලෝග්‍රෑම් 1410 ක් ගොවි පවුල් වෙත ලබා දී ඇත.
7. උතුරු පළාත සඳහා වන සමෘද්ධි පුහුණු මධ්‍යස්ථානය පුදුකුඩියිරුප්පු තේරාවිල් හි ස්ථාපනය කර ඇත.
8. 2023 වර්ෂයේ දී ලෝක ආහාර වැඩසටහන යටතේ කුඩා සිල්ලර වෙළඳුන් 25 දෙනකු සවිබල ගන්වා ඇත.
9. අපගේ දිස්ත්‍රික්කයේ ක්‍රියාත්මක සමෘද්ධි ප්‍රජාමූල සංගම් 497 අතරින් ප්‍රජා මූල සංගම් 132 ක් ඉතා උසස් ලෙස තම වැඩසටහන් සාර්ථකව ක්‍රියාත්මක කර ඇත.
10. ග්‍රාමීය ප්‍රදේශවල පිහිටි සමෘද්ධි බැංකු 10 ක් ඔස්සේ ජංගම බැංකු සේවා (Mobile Bank apps) හඳුන්වා දී ක්‍රියාත්මක කර ඇත.
11. අරුණලු ණය ක්‍රමය යටතේ දිස්ත්‍රික්කයේ පවුල් 10,000 ක් ප්‍රතිලාභ ලබා ඇත.

## 2.2 අභියෝග

1 ආර්ථික අර්බුදයන් හේතුවෙන් මූලික පහසුකම් සහ පොදු සේවාවන් සැපයීම සඳහා ප්‍රමාණවත් ප්‍රතිපාදන නොලැබීම.

2 තාක්ෂණික පහසුකම් ලබාගැනීමේ දී පවතින බාධාවන්.

3 අනපේක්ෂිත ස්වභාවික විපත් හේතුවෙන් ඇතිවන හානි.

4 මත්ද්‍රව්‍ය භාවිතය සහ එහි බලපෑම්.

5 ප්‍රදේශයේ නිෂ්පාදන සඳහා සාධාරණ මිලක් සහ වෙළඳපොල පහසුකම්.

6 කෘෂිකර්මාන්ත, කර්මාන්ත අංශය සහ අනෙකුත් යටිතල පහසුකම් සංවර්ධනය සඳහා ඉඩම් නිදහස් කර නොමැත.

7 උතුරු පළාත සහ නැගෙනහිර පළාත යා කිරීම සඳහා වට්ටුවාන් සහ කෝකිලායි පාලම් අලුත්වැඩියාව සඳහා වන ඇස්තමේන්තු සකස් කළ යුතුය..

## 2.3 අනාගත ඉලක්ක

1. දරිද්‍රතාව දුරලීම.
2. ප්‍රදේශයේ නිෂ්පාදන (කෘෂිකාර්මික, ගෙවතු, ධීවර) දිරිගැන්වීම සහ ස්ථාවර තත්වයකට ගෙන ඒම.
3. ස්වභාවික සම්පත්වල ආරක්ෂාව තහවුරු කිරීම.
4. ආර්ථිකය නැවත නගා සිටුවීමේ අරමුණින් ජනතාව අතර ප්‍රාදේශීය නිෂ්පාදන පිළිබඳ යහපත් ආකල්ප ගොඩනැගීම
5. ක්‍රීඩා අංශය වර්ධනය කර දිස්ත්‍රික් මට්ටමින් පළාතේ පළමුවන ස්ථානය ලබාගැනීම
6. මත්ද්‍රව්‍ය උවදුර තුරන් කිරීම මගින් නිරෝගී සහ උසස් තරුණ පරපුරක් බිහි කිරීම
7. සංස්කෘතික වටිනාකම් සහ අංගයන් සවිමත් කිරීම
8. අධ්‍යාපන අංශයේ ප්‍රතිඵල වර්ධනය කර ගැනීම
9. මුලතිව් දිස්ත්‍රික්කයේ සංචාරක කර්මාන්තය සංවර්ධනය කිරීම.
10. කුඩා සහ මධ්‍ය පරිමාණ කර්මාන්තයන් අපනයන මට්ටමට වැඩිදියුණු කිරීම.

අ. උමාමහේෂ්වරන්
දිස්ත්‍රික් ලේකම් / දිසාපති
දිස්ත්‍රික් ලේකම් කාර්යාලය
මුලතිව්

A.Umamaheswaran,
District Secretary/Government Agent,
District Secretariat,
Mullaitivu.

# 03 වන පරිච්ඡේදය

# 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වන සමස්ත මූල්‍ය කාර්ය සාධනය

## 3.1 මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශ

ඒසීඒ-එෆ්

2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වෂර්ය සඳහා
මූල්‍ය කායර්සාධන ප්‍රකාශනය

| සංශෝධිත අයවැය ප්‍රතිපාදන 2023 රු. | | සටහන | 2023 රු. | 2022 රු. | |
|---|---|---|---|---|---|
| - | ආදායම් ලැබීම් | | - | - | |
| - | ආදායම් බදු | 1 | - | - | ඒසීඒ-1 |
| - | දේශීය භාණ්ඩ හා සේවා මත බදු | 2 | - | - | ඒසීඒ-1 |
| - | ජාත්‍යන්තර වෙළදාම මත බදු | 3 | - | - | ඒසීඒ-1 |
| - | බදු නොවන ආදායම් හා වෙනත් | 4 | - | - | ඒසීඒ-1 |
| - | මුළු ආදායම් ලැබීම් (අ) | | - | - | |
| - | ආදායම් නොවන ලැබීම් | | - | - | |
| - | භාණ්ඩාගාර අග්‍රිම | | 1,768,331,952 | 1,142,824,001 | ඒසීඒ-3 |
| - | තැන්පතු | | 163,402,764 | 116,727,727 | ඒසීඒ-4 |
| - | අත්තිකාරම් ගිණුම | | 12,932,512 | 12,443,917 | ඒසීඒ-5 |
| | වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම් | | - | - | |
| - | මුළු ආදායම් නොවන ලැබීම් (ආ) | | 1,944,667,228 | 1,271,995,645 | |
| - | මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ) | | 1,944,667,228 | 1,271,995,645 | |
| | භාණ්ඩාගාරයට ප්‍රේෂණ (ඈ) | | 11,100,000 | 27,158,000.00 | |
| | ශුද්ධ ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඉ = (ඇ)-(ඈ) | | 1,933,567,228 | 1,244,837,645 | |
| | අඩු කළා : වියදම් | | | | |
| - | පුනරාවතර්න වියදම් | | - | - | ඒසීඒ-2(ii) |
| 366,600,000 | වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ | 5 | 337,321,475 | 271,228,230.00 | ඒසීඒ-2(ii) |
| 118,127,040 | අනෙකුත් භාණ්ඩ හා සේවා | 6 | 107,335,465 | 85,066,357.00 | ඒසීඒ-2(ii) |
| 419,415,000 | සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම් | 7 | 387,340,733 | 272,009.00 | ඒසීඒ-2(ii) |
| - | පොළී ගෙවීම් | 8 | - | - | ඒසීඒ-2(ii) |
| 157,960 | වෙනත් පුනරාවතර්න වියදම් | 9 | 157,960 | - | ඒසීඒ-2(ii) |
| 904,300,000 | මුළු පුනරාවතර්න වියදම් (ඊ) | | 832,155,633 | 356,566,596 | |
| | මූලධන වියදම් | | | | |
| 24,000,000 | මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම් | 10 | 22,280,648 | 16,391,407.00 | ඒසීඒ-2(ii) |
| 6,700,000 | මූලධන වත්කම් අත්පත් කර ගැනීම් | 11 | 6,563,160 | 5,497,585.00 | ඒසීඒ-2(ii) |
| - | ප්‍රාග්ධන මාරුකිරීම් | 12 | - | - | ඒසීඒ-2(ii) |
| - | මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම | 13 | - | - | ඒසීඒ-2(ii) |
| 3,000,000 | හැකියා වධර්නය | 14 | 1,418,258 | 1,401,701.00 | ඒසීඒ-2(ii) |
| - | වෙනත් මූලධන වියදම් | 15 | - | 200,896,046.00 | ඒසීඒ-2(ii) |
| 33,700,000 | මුළු මූලධන වියදම් (උ) | | 30,262,066 | 224,186,739 | |
| | තැන්පතු ගෙවීම් | | 185,572,234 | 131,043,436.00 | ඒසීඒ-4 |
| | අත්තිකාරම් ගෙවීම් | | 15,625,549 | 10,150,974.00 | ඒසීඒ-5 |
| | වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ගෙවීම් | | - | - | |
| | ප්‍රධාන ලෙජර් වියදම් (ඌ) | | 201,197,783 | 141,194,410 | |
| | මුළු වියදම් එ = (ඊ+උ+ඌ) | | 1,063,615,482 | 721,947,745.00 | |
| 938,000,000 | දෙසැම්බර් 31 දිනට ශේෂය ඒ = (ඉ-එ) | | 869,951,746 | 522,889,900 | |
| | අග්‍රිම ගැලපුම් ප්‍රකාශනය අනුව ශේෂය | | 869,951,746 | 522,889,900.00 | ඒසීඒ-7 |
| | දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය | | | | ඒසීඒ-3 |
| | | | 869,951,746 | 522,889,900 | |

## 3.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

ඒසීඒ-පී

**2023 දෙසැම්බර් 31 දිනට**
**මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය**

| | සටහන | තත්‍ය 2023 රු. | 2022 රු. |
|---|---|---|---|
| <u>මූල්‍ය නොවන වත්කම්</u> | | | |
| දේපළ, පිරියත හා උපකරණ | ඒසීඒ-6 | 1,383,024,529 | 1,432,058,050 |
| <u>මූල්‍ය වත්කම්</u> | | | |
| අත්තිකාරම් ගිණුම් | ඒසීඒ-5/5(ඒ) | 41,877,721 | 39,184,685 |
| මුදල් හා මුදල් සමාන දෑ | ඒසීඒ-3 | - | 27,158,000 |
| මුළු වත්කම් | | **1,424,902,250** | **1,498,400,735** |
| <u>ශුද්ධ වත්කම් / ස්කන්ධය</u> | | | |
| භාණ්ඩාගාරය වෙත ශුද්ධ වත්කම් | | 30,259,562 | 5,397,056 |
| දේපළ පිරියත හා උපකරණ සංචිතය | | 1,383,024,529 | 1,432,058,050 |
| කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය | ඒසීඒ-5(බී) | | |
| <u>ජංගම වගකීම්</u> | | | |
| තැන්පතු ගිණුම් | ඒසීඒ-4 | 11,618,159 | 33,787,629 |
| අග්‍රිම ශේෂය | ඒසීඒ-3 | - | 27,158,000 |
| මුළු වගකීම් | | **1,424,902,250** | **1,498,400,735** |

පිටු අංක 07 සිට 54 දක්වා ඒසීඒ 1 සිට ඒසීඒ 7 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ ඇමුණුම් පිටු අංක 55 සිට 62 දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තගර්ත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පොදුවේ පිළිගත් ගිණුම් මූලධර්මවලට අනුකූලව සිදුකර ඇති අතර මෙහිදී මූල්‍ය ප්‍රකාශනයන්හි සටහන් මගින් හෙළිදරව් කර ඇති පරිදි වඩාත් සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිත කර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

මූල්‍ය පාලනය සඳහා ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් වාතර්‍ාකරණ ආයතනය තුළ පවතින බවත් මූල්‍ය පාලනය සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලතාවය අධීක්ෂණය කිරීමටත් ඒ අනුව එම පද්ධති ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පරිදි වෙනස් කිරීම් සිදුකිරීමට වරින් වර සමාලෝචන සිදුකරන බවත් මෙයින් සහතික කරමු.

| | | |
|---|---|---|
| ........................ | ................. | ........................................ |
| ප්‍රධාන ගණන්දීමේ නිලධාරි | ගණන්දීමේ නිලධාරි | ප්‍රධාන මූල්‍ය නිලධාරි/ප්‍රධාන ගණකාධිකාරී/ අධ්‍යක්ෂ (මුදල්)/ කොමසාරිස් (මුදල්) |
| නම : ප්‍රදීප් යසරත්න | නම : අ.උමාමකේෂ්වරන් | නම : ම.සෙල්වරත්තිනම් |
| තනතුර : ලේකම්, රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය | තනතුර : දිස්ත්‍රික් ලේකම්, දිස්ත්‍රික් ලේකම් කායර්ාලය, මුලතිව්. | |
| දිනය : 2024/02/19 | දිනය : 16/02/2024 | දිනය : 16/02/2024 |

ප්‍රදීප් යසරත්න
ලේකම්
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය
(ස්වදේශ කටයුතු අංශය)
"නිල මැදුර" ඇල්වටගල මාවත, කොළඹ 07.

A.Umamaheswaran,
District Secretary/Government Agent
District Secretariat,
Mullaitivu.

M.SELVARATNAM
Chief Accountant
For Govt.Agent/District Secretary
District Secretariat
Mullaitivu.

## 3.3 මුදල් ප්‍රවාහ ප්‍රකාශය

ජීසීඒ-සී

2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

| | සටහන | 2023 රු. | 2022 රු. |
|---|---|---|---|
| <u>මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u> | | | |
| මුළු බදු ලැබීම් | | - | - |
| ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර | | - | - |
| ලාභ | | - | - |
| ආදායම් නොවන ලැබීම් | | - | - |
| වෙනත් ආදායම් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම් | | 46,872,955 | 51,506,645 |
| අග්‍රිම ලැබීම් | | 1,768,331,952 | 1,142,824,001 |
| අත්තිකාරම් අයකර ගැනීම් | | 16,227,959 | 15,010,527 |
| තැන්පතු ලැබීම් | | 163,402,764 | 116,727,727 |
| මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ) | | **1,994,835,630** | **1,326,068,900** |
| <u>අඩුකළා : මුදල් වැය කිරීම්</u> | | | |
| පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම් | | 444,012,825 | 355,844,297 |
| සහනාධාර සහ මාරුකිරීම් | | 387,340,733 | 272,009 |
| වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම් | | 919,564,089 | 574,673,632 |
| භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම | | 11,100,000 | 27,158,000 |
| අත්තිකාරම් ගෙවීම් | | 20,554,549 | 16,127,857 |
| තැන්පතු ගෙවීම් | | 185,572,234 | 131,043,436 |
| මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ) | | **1,968,144,430** | **1,105,119,231** |
| මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ )=(අ)-(ආ) | | **26,691,200** | **220,949,669** |
| <u>ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u> | | | |
| පොළී | | 1,892,227 | 2,013,221 |
| ලාභාංශ | | - | - |
| හිමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම | | 1,678,640 | 203,060 |
| උපණය අයකර ගැනීම් | | - | - |
| ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඈ) | | **3,570,867** | **2,216,281** |
| <u>අඩුකළා : මුදල් වැය කිරීම්</u> | | | |
| භෞතික වත්කම් ඉදිකිරීම් හෝ මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්කර ගැනීම් | | 30,262,066 | 223,165,950 |
| ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ) | | **30,262,066** | **223,165,950** |
| ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය ( ඊ)=(ඈ)-(ඉ) | | **(26,691,200)** | **(220,949,669)** |
| මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=( ඇ) + (ඊ) | | **0** | **(0)** |
| <u>මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u> | | | |
| දේශීය ණය ගැනීම් | | - | - |
| විදේශීය ණය ගැනීම් | | - | - |
| ප්‍රදානයන් ලැබීම් | | - | - |
| මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ) | | - | - |
| <u>අඩුකළා : මුදල් වැය කිරීම්</u> | | | |
| දේශීය ණය ආපසු ගෙවීම් | | - | - |
| විදේශීය ණය ආපසු ගෙවීම් | | - | - |
| මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ) | | - | - |
| මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ) | | - | - |
| මුදල්වල ශුද්ධ වෙනස්වීම් (ඔ) = (උ)+(ඒ) | | - | - |
| ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය | | - | - |
| දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය | | - | - |

3

## 3.4 මූල්‍ය ප්‍රකාශ සටහන්

ඇමුණුම - (i)

# පාඩු හා අත්හැරීම් පිළිබඳ ප්‍රකාශනය
(මු.රෙ. 106 හා මු.රෙ. 113 යටතේ වන පාඩු)

වියදම් ශීර්ෂ අංකය: 267 අමාත්‍යාංශයේ/දෙපාතර්මේන්තුවේ/දිස්ත්‍රික් ලේකම් කායර්ාලයේ නම: මුලතිව්

වැඩසටහන් අංකය හා නාමය : 01

(i) වර්ෂය තුළ අලාභ අයකර ගැනීම/කපාහැරීම/අත්හැරීම පිළිබඳ ප්‍රකාශනය

| අගය | | සිද්ධි සංඛ්‍යාව | මුළු එකතුව (රු) |
|---|---|---|---|
| රු 25,000.00 | අඩු | නැත | නැත |
| රු 25,000.01 | වැඩි | නැත | නැත |
| එකතුව | | නැත | නැත |

| අලාභයේ ස්වභාවය අනුව සිද්ධි වර්ගීකරණය | සිද්ධි සංඛ්‍යාව | අගය (රු) |
|---|---|---|
| 1 | නැත | නැත |
| 2 | නැත | නැත |
| 3 | නැත | නැත |
| 4 | නැත | නැත |
| එකතුව | නැත | නැත |

(ii) තවදුරටත් අයකර ගැනීමට හෝ කපා හැරීමට හෝ අත්හැරීමට ඇති පාඩු පිළිබඳ ප්‍රකාශනය

| අගය | | සිද්ධි සංඛ්‍යාව | මුළු එකතුව (රු) |
|---|---|---|---|
| රු 25,000.00 | අඩු | නැත | නැත |
| රු 25,000.01 | වැඩි | නැත | නැත |
| එකතුව | | නැත | නැත |

| අලාභයේ ස්වභාවය අනුව සිද්ධි වර්ගීකරණය | සිද්ධි සංඛ්‍යාව | අගය (රු) |
|---|---|---|
| 1 | නැත | නැත |
| 2 | නැත | නැත |
| 3 | නැත | නැත |
| 4 | නැත | නැත |
| එකතුව | නැත | නැත |

(ii) අනුව කාල විශ්ලේෂණය

| | | |
|---|---|---|
| වසර 5 ට අඩු | සිද්ධි සංඛ්‍යාව | |
| | ගණන | රු |
| වසර 5-10 | සිද්ධි සංඛ්‍යාව | |
| | ගණන | රු |
| වසර 10 ට වැඩි | සිද්ධි සංඛ්‍යාව | |
| | ගණන | රු |

සටහන - වැය විෂය 1701 යටතේ වර්ෂය තුළ ගිණුම්ගත කරන ලද හෝ ඉදිරි වර්ෂවලදී ගිණුම්ගත කිරීමට අපේක්ෂිත මු.රෙ. 106 යටතේ වන හානි හා මු.රෙ 113 යටතේ වන අත්හැරීම් පිළිබඳ විස්තර ඇතුළත් කළ යුතු ය.

............................................

ප්‍රධාන මූල්‍ය නිලධාරි/ ප්‍රධාන ගණකාධිකාරි/

අධ්‍යක්ෂ (මුදල්) /කොමසාරිස් (මුදල්)

දිනය : 2024.02.16

Chief Accountant
For Govt.Agent/District Secretary
District Secretariat
Mullaitivu.

* තම වාතර්ාකරණ ආයතනයේ මෙම වාතර්ාවලට අදාලව තොරතුරු නොමැති අවස්ථාවල හිස් වාතර්ාවක් ඉදිරිපත් කළ යුතු ය.

55

ඇමුණුම -(ii)

# පොත්වලින් කපාහැරීම පිළිබඳ ප්‍රකාශනය

වියදම් ශීෂර් අංකය : 267 අමාත්‍යාංශයේ/ දෙපාතර්මේන්තුවේ/දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නම : මුලතිව්

වැඩසටහන් අංකය හා නාමය: 1

1 වෂර්ය තුළ සිදුවූ මූ.රෙ.109 යටතේ වන පාඩු හා අත්හැරීම් පිළිබඳ ප්‍රකාශනය

| | අගය | | සිද්ධි සංඛ්‍යාව | වටිනාකම (රු) |
|---|---|---|---|---|
| (i) | රු. 25,000.00 අඩු | .............. | 3 | 61216.70 |
| (ii) | රු. 25,000.01 වැඩි | .............. | 2 | 96743.20 |
| | එකතුව | | 5 | 157959.90 |

2 වෂර්ය තුළ මූ.රෙ. 109 යටතේ වන පොතෙන් කපා හැරීම් හා අයකර ගැනීම් පිළිබඳ ප්‍රකාශනය

| | අලාභයේ ස්වභාවය | ආරම්භක කපා නොහල ශේෂය | අලාභයේ වටිනාකම | අයකර ගැනීම් | පොතෙන් කපා හල අගය | කපා නොහල ඉදිරියට ගෙනයන ශේෂය | පොතෙන් කපා හැරීම සඳහා වූ අනුමැතියේ යොමු අංකය |
|---|---|---|---|---|---|---|---|
| | | රු. | රු. | රු. | රු. | රු. | |
| 1 | Public Officers Advance | 18579.62 | 18579.62 | - | 18579.62 | - | HA/F/DA/10/WOLB/D13 |
| 2 | Public Officers Advance | 17957.08 | 17957.08 | - | 17957.08 | - | HA/F/DA/10/WOLB/D13 |
| 3 | Public Officers Advance | 24680.00 | 24680.00 | - | 24680.00 | - | HA/F/DA/10/WOLB/D13 |
| 4 | Public Officers Advance | 54363.20 | 54363.20 | - | 54363.20 | - | PFD/RED/WO/2022/22 |
| 5 | Public Officers Advance | 42380.00 | 42380.00 | - | 42380.00 | - | PFD/RED/WO/2022/22 |
| | එකතුව | 157959.90 | 157959.90 | - | 157959.90 | - | |

සටහන - සටහන (i) හි ඇතුළත් ගිණුම්ගත කළ යුතු පාඩු හා අත්හැරීම් හැර මූ.රෙ. 109 යටතේ වන අනෙකුත් පාඩු හා අත්හැරීම් පමණක් මෙම ආකෘතියේ ඇතුළත් කළ යුතු ය.

.............................................

ප්‍රධාන මූල්‍ය නිලධාරි/ ප්‍රධාන ගණකාධිකාරි/
අධ්‍යක්ෂ (මුදල්) /කොමසාරිස් (මුදල්)
දිනය : 2024.02.16

M.SELVARATNAM
Chief Accountant
For Govt.Agent/District Secretary
District Secretariat
Mullaitivu.

* තම වාතර්ාකරණ ආයතනයේ මෙම වාතර්ාවලට අදාළව තොරතුරු නොමැති අවස්ථාවල හිස් වාතර්ාවක් ඉදිරිපත් කළ යුතු ය.

56

ඇමුණුම - (iii)

## දෙසැම්බර් 31 දිනට බැඳීම් හා බැරකම් පිළිබඳ ප්‍රකාශනය

ඇමුණුම - (iii) ආකෘතිය වෙනුවට නව CIGAS වෙබ් යෙදුම මගින් ජනනය කරන ලද සමුච්චිත බැඳීම් හා බැරකම් වාතර්ාව මෙහි අමුණා තිබිය යුතු ය.

57

ඇමුණුම - (iv)

# බැරකම් පිළිබඳ ප්‍රකාශනය - (i)

## මු.රෙ.94 (2) සහ (3) ප්‍රකාරව බැරකම්වලට එළඹෙන ලද බැඳීම් ප්‍රකාශනය

අමාත්‍යාංශයේ/ දෙපාතර්මේන්තුවේ/ දිස්ත්‍රික් ලේකම් කායර්ාලයේ නම: මුලතිව්
වියදම් ශීෂර් අංකය: 267
වැඩසටහන් අංකය හා නාමය: 01

| පුද්ගලයාගේ/ආයතනයේ නම | බැඳීම් පිළිබඳ විස්තරය | ව්‍යාපෘතිය | උප ව්‍යාපෘතිය | වැය විෂය සංකේතය | මූල්‍යකරණ සංකේතය | මු.රෙ. 94(2) හි සඳහන් ප්‍රතිපාදන අනුව එළඹිය හැකි උපරිම බැඳීම් සීමාව (රු.) | මු.රෙ. 94(3) අනුව මුළු පිරිවැය ඇස්තමේන්තුව (රු.) | බැඳීම් හා බැරකම් වටිනාකම (රු.) |
|---|---|---|---|---|---|---|---|---|
| 1. අමාත්‍යාංශ/රජයේ දෙපාතර්මේන්තු | නැත | | | | | | | |
| .................................. | | | | | | | | xx |
| .................................. | | | | | | | | xx |
| එකතුව | | | | | | | | |
| 2. රාජ්‍ය සංස්ථා /ව්‍යවස්ථාපිත මණ්ඩල | | | | | | | | |
| .................................. | | | | | | | | xx |
| .................................. | | | | | | | | xx |
| එකතුව | | | | | | | | |
| 3. වෙනත් (පෞද්ගලික අංශය) | | | | | | | | |
| .................................. | | | | | | | | xx |
| .................................. | | | | | | | | xx |
| එකතුව | | | | | | | | |
| මුළු එකතුව | | | | | | | | |

..................................................
ප්‍රධාන මූල්‍ය නිලධාරී/ ප්‍රධාන ගණකාධිකාරී/
අධ්‍යක්ෂ (මුදල්) /කොමසාරිස් (මුදල්)
දිනය : 16.02.2024

M.SELVARATNAM
Chief Accountant
For Govt.Agent/District Secretary
District Secretariat
Mullaitivu.

58

# බැරකම් පිළිබඳ ප්‍රකාශනය - (ii)

## මු.රෙ.215 (3) (ආ) සහ (ඇ) ප්‍රකාරව තැන්පත් ගිණුමට මාරු කරන ලද ප්‍රතිපාදන

අමාත්‍යාංශයේ/ දෙපාතර්මේන්තුවේ/ දිස්ත්‍රික් ලේකම් කායර්ාලයේ නම: මුලතිව්
වියදම් ශීෂර් අංකය: 267
වැඩසටහන් අංකය හා නාමය: 01

| පුද්ගලයාගේ/ආයතනයේ නම*<br>(ප්‍රතිපාදන මාරු කරන විට හඳුනාගෙන තිබිය යුතුය) | වගකීම් පිළිබඳ විස්තරය | ණයවර ලිපි අංක ආදිය | ප්‍රතිපාදන මාරු කරනු ලැබුවේ කුමන වැය ශීෂර්යකින්ද | | | | තැන්පතු ගිණුම් අංකය | මාරුකරන ලද මුදල රු. |
|---|---|---|---|---|---|---|---|---|
| | | | ව්‍යාපෘතිය | උප ව්‍යාපෘතිය | වැය විෂය සංකේතය | මූල්‍යකරණ සංකේතය | | |
| 1. අමාත්‍යාංශ/රජයේ දෙපාතර්මේන්තු | නැත | | | | | | | |
| ................................. | | | | | | | | XX |
| ................................. | | | | | | | | XX |
| එකතුව | | | | | | | | |
| 2. රාජ්‍ය සංස්ථා /ව්‍යවස්ථාපිත මණ්ඩල | | | | | | | | |
| ................................. | | | | | | | | XX |
| ................................. | | | | | | | | XX |
| එකතුව | | | | | | | | |
| 3. වෙනත් (පෞද්ගලික අංශය) | | | | | | | | |
| ................................. | | | | | | | | XX |
| ................................. | | | | | | | | XX |
| එකතුව | | | | | | | | |
| මුළු එකතුව | | | | | | | | |

..............................................
ප්‍රධාන මූල්‍ය නිලධාරි/ ප්‍රධාන ගණකාධිකාරි/
අධ්‍යක්ෂ (මුදල්) /කොමසාරිස් (මුදල්)
දිනය : 2024.02.16

M.SELVARATNAM
Chief Accountant
For Govt.Agent/District Secretary
District Secretariat
Mullaitivu.

* නම ව්‍යාපාරකරණ ආයතනයට අදාළ නම් පමණක් ආකෘතිය භාවිත කළ යුතු ය.

59

# ප්‍රතිපූරණය කළ හැකි විදේශාධාරවලට අදාළ හිමිකම් පිළිබඳ ප්‍රකාශනය

අමාත්‍යාංශයේ/ දෙපාතර්මේන්තු අමාත්‍යාංශයේ/ දෙපාතර්මේන්තුවේ/ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නම :මුලතිව්

වැඩසටහන් අංකය හා නාමය : 01

| | | රු. |
|---|---|---|
| (1) | ප්‍රතිපූරණය කළ හැකි විදේශාධාර යටතේ, පරිපූරක වෙන්කිරීම්ද ඇතුළුව 2023 ඇස්තමේන්තුගත වෙන්කිරීම් | නැත |
| (2) | ඉහත (1) ට අදාළ 2023 වර්ෂය තුළදී දරන ලද මුළු වියදම | නැත |
| (3) | 2023 ජනවාරි 01 දිනට ලැබීමට නියමිත තිබූ ප්‍රතිපූරණය කළ හැකි විදේශාධාරවලට අදාළ හිමිකම් පැමිවල එකතුව | නැත |
| (4) | 2022 හා ඊට පෙර වර්ෂවලට අදාළව, 2023 වර්ෂය තුළදී කරන ලද ප්‍රතිපූරණය කළ හැකි විදේශාධාරවලට අදාළ හිමිකම් පැමිවල එකතුව (ඇත්නම්) | නැත |
| (5) | 2023 වර්ෂය සම්බන්ධයෙන් 2023 වර්ෂය තුළදී කරන ලද ප්‍රතිපූරණය කළ හැකි විදේශාධාරවලට අදාළ හිමිකම් පැමිවල එකතුව | නැත |
| (6) | 2022 හා ඊට පෙර වර්ෂ වෙනුවෙන් වූ හිමිකම්පෑම් සම්බන්ධයෙන් 2023 වර්ෂයේදී ආධාර දෙන ආයතන විසින් ඉඩ නොදෙන ලද හිමිකම් පැමිවල එකතුව | නැත |
| (7) | 2023 වර්ෂය සම්බන්ධයෙන් 2023 වර්ෂය තුළදී ආධාර දෙන ආයතන විසින් ඉඩ නොදෙන ලද හිමිකම් පැමිවල එකතුව | නැත |
| (8) | 2022 හා ඊට පෙර වර්ෂ වෙනුවෙන් 2023 වර්ෂය තුළදී ලැබුණු ප්‍රතිපූරණවල මුළු එකතුව | නැත |
| (9) | 2023 වර්ෂය වෙනුවෙන් 2023 වර්ෂය තුළදී ලැබුණු ප්‍රතිපූරණවල එකතුව | නැත |
| (10) | 2023 දෙසැම්බර් 31 දිනට ලැබීමට නියමිතව තිබූ ප්‍රතිපූරණය කළ හැකි විදේශාධාරවලට අදාළ හිමිකම් පැමිවල එකතුව {(3+4+5) - (6+7) } - (8+9) | නැත |
| (11) | මූල්‍ය ප්‍රකාශ පිළියෙල කර අවසන් වූ දිනය දක්වා 2023 වර්ෂය සම්බන්ධයෙන් 2023 දෙසැම්බර් 31 දිනෙන් පසුව කරන ලද ප්‍රතිපූරණය කළ හැකි විදේශාධාරවලට | නැත |
| (12) | මූල්‍ය ප්‍රකාශ පිළියෙල කර අවසන් වූ දිනය දක්වා 2023 දෙසැම්බර් 31 දිනෙන් පසුව ලැබුණු ප්‍රතිපූරණවල එකතුව | නැත |
| (13) | මූල්‍ය ප්‍රකාශ පිළියෙල කර ඉදිරිපත් කරන ලද දිනට ලැබීමට නියමිතව ඇති ප්‍රතිපූරණය කළ හැකි විදේශාධාරවලට අදාළ හිමිකම් පැමිවල එකතුව (10 + 11 - 12) | නැත |

.......................................................
ප්‍රධාන මූල්‍ය නිලධාරී/ ප්‍රධාන ගණකාධිකාරී/අධ්‍යක්ෂ (මුදල්) / කොමසාරිස් (මුදල්)
දිනය 2024.02.16

M.SELVARATNAM
Chief Accountant
For Govt.Agent/District Secretary
District Secretariat
Mullaitivu.

* තම වාතර්ාකරණ ආයතනයට අදාළ නම් පමණක් ආකෘතිය භාවිත කළ යුතු ය.

ඇමුණුම - (vii)

# අස්ථානගත වවුචර් පිළිබඳ ප්‍රකාශනය

අමාත්‍යාංශයේ/දෙපාතර්මේන්තුවේ/දිස්ත්‍රික් ලේකම් කායර්ාලයේ නම: මුලතිව්

වියදම් ශීෂර් අංකය: 267

වැඩසටහන් අංකය හා නාමය:

| දිනය | වවුචර් අංකය | ආදායකයාගේ නම | ගෙවීමේ ස්වභාවය | ගණන (රු) |
|---|---|---|---|---|
| | | නැත | | |

................................................

ප්‍රධාන මූල්‍ය නිලධාරි/ ප්‍රධාන ගණකාධිකාරි/

අධ්‍යක්ෂ (මුදල්) /කොමසාරිස් (මුදල්)

දිනය : 2024.02.16

M.SELVARATNAM
Chief Accountant
For Govt.Agent/District Secretary
District Secretariat
Mullaitivu.

* තම වාතර්ාකරණ ආයතනයේ මෙම වාතර්ාවලට අදාළව තොරතුරු නොමැති අවස්ථාවල හිස් වාතර්ාවක් ඉදිරිපත් කළ යුතු ය.

61

ඇමුණුම - (viii)

## 2015/10/23 දින නිකුත් කරන ලද භාණ්ඩාගාර මෙහෙයුම් චක්‍රලේඛ අංක 2015/03 හි උපදෙස්වලට අනුකූලව ආරම්භ කරන ලද බැංකු ගිණුම් පිළිබඳ 2023.12.31 දිනට තත්ත්ව වාතර්‍ාව

වියදම් ශීර්ෂ අංකය: 267 අමාත්‍යාංශයේ/ දෙපාතර්මේන්තුවේ/ දිස්ත්‍රික් ලේකම් කායර්ාලයේ නම: මුලතිව්

| අනු අංකය | බැංකුවේ නම | ගිණුම් අංකය | 2023.12.31 දිනට බැංකු ප්‍රකාශනය අනුව ශේෂය (රු.) | 2023.12.31 දිනට මුදල් පොත අනුව ශේෂය (රු.) | 2023.12.31 දිනට බැංකුවට ඉදිරිපත් නොකරන ලද චෙක්පත් එකතුව (මාස 6 ට වැඩි ඇතොත්) | අවසාන වරට බැංකු සැසඳුම් සකස් කළ මාසය |
|---|---|---|---|---|---|---|
| 1 | ලංකා බැංකුව | 7041976 | - | - | | December |
| 2 | ලංකා බැංකුව | District Secretary Mullaitivu - 7041979 | 35,988,593.51 | - | | December |
| 3 | ලංකා බැංකුව | Divisional Secretary Maritimepattu - 7042838 | 15,566,261.08 | - | | December |
| 4 | ලංකා බැංකුව | Divisional Secretary Puthukkudiyiruppu - 7042837 | 21,077,463.59 | - | | December |
| 5 | ලංකා බැංකුව | Divisional Secretary Oddusuddan - 7041978 | 7,248,743.19 | - | | December |
| 6 | ලංකා බැංකුව | Divisional Secretary Thunukkai - 7041981 | 9,831,427.58 | - | | December |
| 7 | ලංකා බැංකුව | Divisional Secretary Manthai East - 7041980 | 5,775,055.51 | - | | December |
| 8 | ලංකා බැංකුව | Divisional Secretary Welioya - 7042845 | 14,727,415.42 | - | | December |

ඉහත සඳහන් තොරතුරු සත්‍ය හා නිවැරදි බවට තහවුරු කරමි.

.............................................
ප්‍රධාන මූල්‍ය නිලධාරි/ ප්‍රධාන ගණකාධිකාරි/
අධ්‍යක්ෂ (මුදල්) /කොමසාරිස් (මුදල්)
දිනය : 2024.02.16

M.SELVARATNAM
Chief Accountant
For Govt.Agent/District Secretary
District Secretariat
Mullaitivu.

62

## 3.5 ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය

| ආදායම් කේතය | ආදායම් කේත විස්තරය | ආදායම් ඇස්තමේන්තුව | | එකතු කරන ලද ආදායම | |
|---|---|---|---|---|---|
| | | මූලික | අවසන් | මුදල (රු.) | අවසන් ඇස්තමේන්තුවේ ප්‍රතිශතයක් ලෙස |
| 1002.07.00 | | | | 800.00 | - |
| 1003.07.02 | රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කිරීමේ ගාස්තු | 3,750,000.00 | 3,750,000.00 | 7,131,860.00 | - |
| 1003.07.03 | පුද්ගලික ප්‍රවාහන | 60,000.00 | 60,000.00 | 41,085.08 | - |
| 1003.07.05 | ආරක්ෂක අමාත්‍යාංශයට අදාල අවසර පත්‍ර ගාස්තු | 30,000.00 | 30,000.00 | 34,400.00 | - |
| 1003.07.99 | බලපත්‍ර බදු | 75,000.00 | 75,000.00 | 50,455.60 | - |
| 2002.01.01 | රජයේ ගොඩනැගිලි හා නිවාස කුලී | 1,500,000.00 | 1,500,000.00 | 2,285,826.91 | - |
| 2002.02.99 | පොලී - වෙනත් | 1,750,000.00 | 1,750,000.00 | 1,892,226.55 | - |
| 2003.01.00 | විවිධ අංශවල විකුණුම් | | | | - |
| 2003.02.03 | පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ පනත යටතේ ගාස්තු | 925,000.00 | 925,000.00 | 4,014,700.00 | - |
| 2003.02.06 | උද්භිද විද්‍යා හා වනසත්ව සංරක්ෂණ ආඥා පනත යටතේ වූ ගාස්තු | 50,000.00 | 50,000.00 | 48,800.00 | - |
| 2003.02.13 | විභාග සහ වෙනත් ගාස්තු | 10,000.00 | 10,000.00 | 1800.00 | - |
| 2003.02.14 | මෝටර් රථ ප්‍රවාහන පනත යටතේ වූ ගාස්තු | 15,000,000.00 | 15,000,000.00 | 8,045,905.00 | - |
| 2003.02.99 | පරිපාලන ගාස්තු - අනෙකුත් | - | - | 144,300.00 | - |
| 2003.99.00 | වෙනත් ලැබීම් | 1,000,000.00 | 1,000,000.00 | 8,189,270.84 | - |
| 2003.07.00 | වී අත්තිකාරම් | | | | - |
| 2004.01.00 | සමාජ ආරක්ෂණ දායකත්වයන් – වැන්දඹු හා අනත්දරු | 16,000,000.00 | 16,000,000.00 | 16,885,551.09 | - |
| 2006.02.02 | ප්‍රාග්ධන වත්කම් විකුණුම් | 175,000.00 | 175,000.00 | 378,640.00 | - |
| 2006.02.01 | වාහන විකුණුම් | | | 1,300,000.00 | |
| | | **40,325,000.00** | **40,325,000.00** | **50,445,621.07** | |

## 3.6 ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය

| ප්‍රතිපාදන වර්ගය | ප්‍රතිපාදන | | තත්‍ය වියදම් | උපයෝගී කරනු ලැබූ ප්‍රතිපාදන, අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | මූලික | අවසන් | | |
| පුනරාවර්තන | 1,638,474,133.74 | 1,638,474,133.74 | **1,555,194,931.30** | **94%** |
| ප්‍රාග්ධන | 231,374,214.61 | 231,374,214.61 | **225,984,782.70** | **97%** |

## 3.7 මු.රෙ. 208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ / දෙපාර්තමේන්තුවල නියෝජිතයකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට / දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට / පළාත් සභාවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන

| | ප්‍රතිපාදන ලබාදුන් අමාත්‍යාංශය / දෙපාර්තමේන්තුව | ප්‍රතිපාදන අරමුණ | ප්‍රතිපාදන | | තත්‍ය වියදම | උපයෝගී කරනු ලැබූ ප්‍රතිපාදන, අවසාන ප්‍රතිපාදනයේ % ලෙස |
|---|---|---|---|---|---|---|
| | | | මූලික | අවසන් | | |
| 001 | ජනාධිපති ලේකම් කාර්යාලය | ප්‍රාග්ධන වියදම් | 12,755,597.27 | | 12,755,597.27 | 100% |
| | | පුනරාවර්තන වියදම් | 95,000.00 | | 94,970.00 | 100% |
| 102 | මුදල් ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය | ප්‍රාග්ධන වියදම් | - | | - | |
| | | පුනරාවර්තන වියදම් | 1,160,200.00 | | 997,455.58 | 86% |
| 103 | ආරක්ෂක අමාත්‍යාංශය | ප්‍රාග්ධන වියදම් | 2,323,844.95 | | 2,298,986.04 | 99% |
| | | පුනරාවර්තන වියදම් | 5,721,997.50 | | 5,055,681.58 | 88% |
| 110 | අධිකරණ අමාත්‍යාංශය | ප්‍රාග්ධන වියදම් | 1,780,000.00 | | 1,767,364.60 | 99% |
| | | පුනරාවර්තන වියදම් | 2,755,450.00 | | 2,745,104.12 | 100% |
| 111 | සෞඛ්‍ය අමාත්‍යාංශය | ප්‍රාග්ධන වියදම් | 24,030.00 | | 24,030.00 | 100% |
| | | පුනරාවර්තන වියදම් | 2,571,665.60 | | 2,539,477.82 | 99% |
| 118 | කෘෂිකර්ම අමාත්‍යාංශය | ප්‍රාග්ධන වියදම් | 23,516,130.00 | | 23,513,505.75 | 100% |
| | | පුනරාවර්තන වියදම් | 324,643,154.99 | | 324,548,376.22 | 100% |
| 122 | සංචාරක කටයුතු සහ ඉඩම් අමාත්‍යාංශය | ප්‍රාග්ධන වියදම් | 84,315,000.00 | | 84,315,000.00 | 100% |
| | | පුනරාවර්තන වියදම් | 1,135,500.00 | | 1,075,404.36 | 95% |
| 123 | නාගරික සංවර්ධන සහ නිවාස අමාත්‍යාංශය | ප්‍රාග්ධන වියදම් | 63,574,880.48 | | 62,914,976.53 | 99% |
| | | පුනරාවර්තන වියදම් | - | | - | |
| 126 | කර්මාන්ත අමාත්‍යාංශය | ප්‍රාග්ධන වියදම් | 103,900.00 | | 103,900.00 | 100% |
| | | පුනරාවර්තන වියදම් | 855,800.00 | | 787,100.27 | 92% |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 130 | රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය | ප්‍රාග්ධන වියදම් | 1,081,700.00 | | 1,081,700.00 | 100% |
| | | පුනරාවර්තන වියදම් | 69,055,580.00 | | 65,120,830.27 | 94% |
| 171 | කාන්තා, ළමා කටයුතු සහ සමාජ සවිබල ගැන්වීමේ අමාත්‍යාංශය | ප්‍රාග්ධන වියදම් | 3,390,591.21 | | 3,390,591.21 | 100% |
| | | පුනරාවර්තන වියදම් | 277,235,406.00 | | 275,200,796.20 | 99% |
| 187 | ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යාංශය | ප්‍රාග්ධන වියදම් | 54,475.00 | | 54,475.00 | 100% |
| | | පුනරාවර්තන වියදම් | - | | - | |
| 189 | මහජන ආරක්ෂණ අමාත්‍යාංශය | ප්‍රාග්ධන වියදම් | - | | - | |
| | | පුනරාවර්තන වියදම් | 613,416.00 | | 578,565.50 | 94% |
| 193 | කම්කරු සහ විදේශ රැකියා අමාත්‍යාංශය | ප්‍රාග්ධන වියදම් | 2,750.00 | | 2,750.00 | 100% |
| | | පුනරාවර්තන වියදම් | 270,500.00 | | 248,150.14 | 92% |
| 194 | ක්‍රීඩා සහ යොවන කටයුතු අමාත්‍යාංශය | ප්‍රාග්ධන වියදම් | 1,671,852.00 | | 562,071.31 | 34% |
| | | පුනරාවර්තන වියදම් | 722,162.50 | | 588,646.57 | 82% |
| 201 | බෞද්ධ කටයුතු දෙපාර්තුමේන්තුව | ප්‍රාග්ධන වියදම් | - | | - | 0% |
| | | පුනරාවර්තන වියදම් | 946,563.00 | | 792,452.85 | 84% |
| 206 | සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව | ප්‍රාග්ධන වියදම් | - | | - | 0% |
| | | පුනරාවර්තන වියදම් | 512,000.00 | | 430,089.76 | 84% |
| 210 | රාජ්‍ය තොරතුරු දෙපාර්තමේන්තුව | ප්‍රාග්ධන වියදම් | 39,450.25 | | 39,450.25 | 100% |
| | | පුනරාවර්තන වියදම් | - | | - | |
| 216 | සමාජ සේවා දෙපාර්තමේන්තුව | ප්‍රාග්ධන වියදම් | 54,210.00 | | 54,210.00 | |
| | | පුනරාවර්තන වියදම් | 4,210,480.00 | | 3,015,010.78 | 72% |
| 217 | පරිවාස හා ළමාරක්ෂණ සේවා දෙපාර්තමේන්තුව | ප්‍රාග්ධන වියදම් | 24,000.00 | | 10,000.00 | 42% |
| | | පුනරාවර්තන වියදම් | 395,500.00 | | 374,578.95 | 95% |
| 219 | ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව | ප්‍රාග්ධන වියදම් | - | | - | 0% |
| | | පුනරාවර්තන වියදම් | 70,864.88 | | 62,166.72 | 88% |
| 226 | ආගමන සහ විගමන දෙපාර්තමේන්තුව | ප්‍රාග්ධන වියදම් | - | | - | 0% |
| | | පුනරාවර්තන වියදම් | 12,120.00 | | 12,120.00 | 100% |
| 227 | පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව | ප්‍රාග්ධන වියදම් | - | | - | |
| | | පුනරාවර්තන වියදම් | 6,853,493.79 | | 6,655,761.82 | 97% |
| 228 | අධිකරණ, බන්ධනාගාර කටයුතු සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා | ප්‍රාග්ධන වියදම් | - | | - | |
| | | පුනරාවර්තන වියදම් | 5,063,480.00 | | 5,063,480.00 | 100% |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය | | | | | |
| 252 | ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව | ප්‍රාග්ධන වියදම් | 1,763,378.45 | | 1,743,378.45 | 99% |
| | | පුනරාවර්තන වියදම් | 1,177,744.70 | | 1,115,312.94 | 95% |
| 253 | විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව | ප්‍රාග්ධන වියදම් | - | | - | |
| | | පුනරාවර්තන වියදම් | 878,891.14 | | 871,528.34 | 99% |
| 254 | රෙජිස්ට්‍රාර් ජෙනරාල් දෙපාර්තමේන්තුව | ප්‍රාග්ධන වියදම් | 600,000.00 | | 500,500.00 | 83% |
| | | පුනරාවර්තන වියදම් | - | | - | |
| 267 | රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය | ප්‍රාග්ධන වියදම් | 33,700,000.00 | | 30,262,066.19 | 90% |
| | | පුනරාවර්තන වියදම් | 904,300,000.00 | | 831,353,558.32 | 92% |
| 284 | වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව | ප්‍රාග්ධන වියදම් | - | | - | |
| | | පුනරාවර්තන වියදම් | 50,000.00 | | 50,000.00 | 100% |
| 290 | ධීවර සහ ජලජ සම්පත් දෙපාර්තමේන්තුව | ප්‍රාග්ධන වියදම් | 145,000.00 | | 145,000.00 | 100% |
| | | පුනරාවර්තන වියදම් | - | | - | |
| 303 | පේෂ කර්මාන්ත දෙපාර්තමේන්තුව | ප්‍රාග්ධන වියදම් | - | | - | |
| | | පුනරාවර්තන වියදම් | 102,000.00 | | 102,000.00 | 100% |
| 307 | මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව | ප්‍රාග්ධන වියදම් | - | | - | |
| | | පුනරාවර්තන වියදම් | 431,600.00 | | 414,906.61 | 96% |
| 326 | ප්‍රජා පාදක විශෝධන දෙපාර්තමේන්තුව | ප්‍රාග්ධන වියදම් | - | | - | |
| | | පුනරාවර්තන වියදම් | 80,000.00 | | 50,374.70 | 63% |
| 327 | ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුව | ප්‍රාග්ධන වියදම් | 322,800.00 | | 322,125.10 | 100% |
| | | පුනරාවර්තන වියදම් | 309,000.00 | | 159,283.96 | |
| 328 | මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුව | ප්‍රාග්ධන වියදම් | 130,625.00 | | 123,105.00 | 94% |
| | | පුනරාවර්තන වියදම් | 154,000.00 | | 123,117.75 | 80% |
| 334 | බහුකාර්ය සංවර්ධන කාර්ය සාධක බලකා දෙපාර්තමේන්තුව | ප්‍රාග්ධන වියදම් | - | | - | |
| | | පුනරාවර්තන වියදම් | 26,090,563.64 | | 24,968,629.17 | 96% |
| | **එකතුව** | | **1,869,848,348.35** | **-** | **1,781,179,714.00** | |

## 3.8 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය

| වත්කම් කේතය | කේත විස්තරය | 2022-12-31 දිනැති සමීක්ෂණ මණ්ඩල වාර්තාවට අනුව ශේෂය | 2023 මූල්‍ය තත්ව වාර්තාවට අනුව ශේෂය | ඉදිරියේ දී ලැබිය යුතු | වාර්තා කිරීමේ ප්‍රගතිය % |
|---|---|---|---|---|---|
| 9151 | ගොඩනැගිලි සහ ඉදිකිරීම් | 930,530,754.12 | 953,070,570.83 | - | 100% |
| 9152 | යන්ත්‍ර සහ උපකරණ | 332,683,771.25 | 343,483,062.40 | - | 100% |
| 9153 | ඉඩම් | 82,000,000.00 | 82,000,000.00 | - | 100% |
| 9154 | අස්පෘශ්‍ය වත්කම් | - | - | - | |
| 9155 | ජීව විද්‍යාත්මක වත්කම් | - | - | - | |
| 9160 | වැඩ අවසන් කර නොමැති | 22,539,816.71 | - | - | 100% |
| 9180 | බදු වත්කම් | - | - | - | |

## 3.9 විගණකාධිපති වාර්තාව 2023

මගේ අංකය - NPCG/MU/A/DSMU/FS/2023/01 දිනය - 2024 මැයි 22

දිස්ත්‍රික් ලේකම්
දිස්ත්‍රික් ලේකම් කාර්යාලය
මුලතිව්

**මුලතිව් දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව**

ඉහත වාර්තාව සහ විගණනය සිදුකරන ලද මූල්‍ය ප්‍රකාශනයන් මේ සමඟ ඉදිරිපත් කර ඇත.

පී. පටකුනන්
ජ්‍යෝෂ්ඨ සහකාර විගණකාධිපති
විගණකාධිපති වෙනුවට

පිටපත් - අධ්‍යක්ෂ ජනරාල්, රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව

NPCG/MU/A/DS-MU/FS/2023/01 2024 මැයි මස 22 දින

දිස්ත්‍රික් ලේකම්,

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය,

මුලතිව්

**මුලතිව් දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව**

**විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්වාගණනය කළ මතය

මුලතිව් දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2023 දෙසැම්බර් 31 දින අදාලව මූල්‍ය තත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව මන්නාරම දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, එම මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට මුලතිව් දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ පැවති මූල්‍ය තත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්ය සාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.2 තත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී ල.වි.ප්‍ර.) අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණනයේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මා විශ්වාසය කරමි.

## 1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන් දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලවත් 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 38 වන වගන්තියෙහි සඳහන් විධිවිධානයන්ට අනුකූලවත් සත්‍ය හා සාධාරණ තත්වයන් පිළිබිඹු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන් දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38 (1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන් දීමේ නිලධාරී සහතික විය යුතු අතර, එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන්ගෙන් තොර බවට තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ආර්ථික තීරණ ගැනීමේදී ඒ පිළිබඳව සැලකිලිමත් විය යුතුය.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද මා විසින්,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනා ගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මගහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීම එවන් වංචාවන් ඇතිවීමට හේතුවේ.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් තොරව අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳ පැහැදිලි කිරීමක් ලබාගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී, මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බවට ඇගයීම් කරන ලදී.

මාගේ විගණනයෙන් හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 අනෙකුත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මා විසින් ලබාදෙන ලද උපදෙස් ක්‍රියාවට නංවා තිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස්

### 1.6.1 මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනය

#### 1.6.1.1 පුනරාවර්තන වියදම්

සමාලෝචිත වර්ෂයේ දී යටපත් කිරීමේ තක්සේරු විධිවිධානය මඟින් සංවර්ධන දීමනාවන්, ගෙවීම් සඳහා වෙන්කර තිබූ රු. 419,000,000 ක මුදල මූල්‍ය ප්‍රකාශනයේ ඒසීඒ - 02 සහ ඒසීඒ - 02 (i, ii, iii) ආකෘතියන්හි යටපත් කිරීමේ තක්සේරු විධිවිධානයට අදාළ වැඩසටහනේ ඇතුළත් කළ යුතු වුවද වාර්ෂික තක්සේරු විධිවිධාන වැඩසටහනට ඇතුළත් කර තිබීම හේතුවෙන් වාර්ෂික තක්සේරු විධිවිධාන වැඩසටහනේ එම වටිනාකම වැඩි කොට ද, යටපත් කිරීමේ තක්සේරු විධිවිධාන වැඩසටහනේ එම වටිනාකම අඩු කොටද පෙන්නුම් කර තිබුණි.

#### 1.6.1.2 ප්‍රාග්ධන වියදම්

පහත කරුණු අනාවරණය විය

(අ) සමාලෝචිත වර්ෂය සඳහා වන මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනයේ පෙන්නුම් කර ඇති මූල්‍ය නොවන වත්කම් මිලදී ගැනීම්, අලුත්වැඩියාවන් සහ වැඩිදියුණු කිරීම් සඳහා සම්පූර්ණ එකතුව රු. 28,843,808 ක් ලෙස පෙන්නුම් කර තිබුනද මහා භාණ්ඩාගාර ලේඛනය (SA - 82) ප්‍රකාරව එය රු. 28,703,657 ක් ලෙස ප්‍රකාශ කර තිබීම හේතුවෙන් රු. 140,151 ක විශමතාවයක් නිරීක්ෂණය වේ.

(ආ) දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සවි කොට තිබූ අකුණු සන්නයකය ක්‍රියා විරහිතව තිබීම සහ විදුලි උපකරණ නිසියාකාරව ක්‍රියා විරහිත කර (Switch off) නොතිබීම මත සමාලෝචිත වර්ෂයේ දී අකුණු සැර හේතුවෙන් පාලන ශාඛාව, සැලසුම් ශාඛාව වැනි ඇතැම් අංශවල භාවිතාවේ පැවති පරිගණක යන්ත්‍ර, ඡායා පිටපත් යන්ත්‍ර හානියට පත්වූ අතර ඒවා අලුත්වැඩියා කිරීමට ප්‍රාග්ධන වැය ශීර්ෂයෙන් ගෘහ භාණ්ඩ, කාර්යාල උපකරණ ප්‍රසම්පාදනය කිරීම සඳහා වෙන්කර තිබූ ප්‍රතිපාදනහෙන් මුළු එකතුව රු. 5,634,060 ක ගෙවීම් කර තිබුණි.

### 1.6.2 මූල්‍ය තත්ව ප්‍රකාශනය

#### 1.6.2.1 මූල්‍ය නොවන වත්කම්

සමාලෝචිත වර්ෂය සඳහා වන මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනයේ පෙන්නුම් කර ඇති උපකරණවල වටිනාම සම්පූර්ණ එකතුව රු. 1,383,024,529 ක් ලෙස පෙන්නුම් කර තිබුනද මහා භාණ්ඩාගාර ලේඛනය (SA - 82) ප්‍රකාරව එය රු. 1,378,575,634 ක් ලෙස ප්‍රකාශ කර තිබීම හේතුවෙන් රු. 4,448,895 ක විශමතාවයක් නිරීක්ෂණය වේ.

### 1.6.2.2 අග්‍රිම ගිණුම් ශේෂ

වැඩිහිටි දිවා සුරැකුම් මධ්‍යස්ථා නිර්මාණය කිරීම සඳහා ජාතික වැඩිහිටි මහ ලේකම් කාර්යාලය විසින් 2023-12-29 වන දින දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ බැංකු ගිණුව වෙත තැන්පත් කර තිබූ රු. 8,000,000 ක අග්‍රිම සමාලෝචිත වර්ෂයේ දී අපේක්ෂිත අරමුණ සඳහා යොදා ගැනීමට හෝ මහා භාණ්ඩාගාරය වෙත නැවත හරවා යැවීමට හෝ කටයුතු කර නොතිබූ අතර එම මුදල සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශවල මුදල් සහ මුදල් හා සමාන වත්කම් ලෙස පෙන්නුම් නොකොට සම්පූර්ණයෙන්ම අත්හැර දමා තිබුණි.

### 1.6.3 විගණනය සඳහා සාක්ෂි නොමැති වීම

ලෝක ආහාර වැඩසටහනේ සම්බන්ධීකරණ මහ ලේකම් කාර්යාලය වෙතින් ලැබී තිබූ මූල්‍ය ප්‍රතිපාදනයෙන් විවිධ සේවා සමූපකාර සමිති 04 ක් වෙත ආධාර ද්‍රව්‍ය පැටවීම සහ බෑම සඳහා ගෙවා තිබූ එකතුව රු. 6,667,967 ක මුදල සඳහා වන F14 පත්‍රිකා විගණනයට ඉදිරිපත් නොකිරීම හේතුවෙන් ලබා දී තිබූ භාණ්ඩ, කුලීකරුවන් සහ ගාස්තු ආදිය බෙදාහැර තිබූ භාණ්ඩ සමඟ සම්බන්ධ කොට මෙම ගනුදෙනුව විගණනයේ දී තෘප්තිමත් ලෙස පිළිගෙන සහතික කළ නොහැකි විය.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 වැය කළමනාකරණය

පහත කරුණු නිරීක්ෂණය විය

(අ) සමාලෝචිත වර්ෂයේ දී යෝජනා ක්‍රම - 1 සඳහා පුනරාවර්තන වැය විෂයයෙහි කරුණු 09 ක් සඳහා වෙන්කොට තිබූ මුළු එකතුව රු. 39,745,638 ක ප්‍රතිපාදනයෙන් සියයට 7 සිට සියයට 74 ක් දක්වා ප්‍රමාණවලින් ඉතිරිව තිබූ බැවින් එම ක්‍රියාකාරකම් දුර්වල වී තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ දී යෝජනා ක්‍රම - 1 සඳහා ප්‍රාග්ධන වැය විෂයයෙහි කරුණු 39 ක් සඳහා වෙන්කොට තිබූ ප්‍රතිපාදනයෙන් මුළු එකතුව රු. 3,241,094 ක් සියයට 6 සිට සියයට 53 ක් දක්වා ප්‍රමාණවලින් ඉතිරිව තිබූ බැවින් එම ක්‍රියාකාරකම් සම්පූර්ණ කර නොතිබුණි.

## 2.2 අනෙකුත් අමාත්‍යාංශ සහ දෙපාර්තමේන්තු මගින් ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන භාවිතය

පහත කරුණු නිරීක්ෂණය විය

(අ) සමාලෝචිත වර්ෂයේ දී අමාත්‍යාංශ 05 ක් සහ දෙපාර්තමේන්තු 02 කට අදාළ පුනරාවර්තන වැය ශීර්ෂයන් සඳහා වෙන්කොට තිබූ ප්‍රතිපාදනයෙන් මුළු එකතුව රු. 6,269,256 ක් එනම් සියයට 6 සිට සියයට 25 ක් දක්වා ඉතිරිව තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ දී ක්‍රීඩා සහ යෞවන කටයුතු අමාත්‍යාංශය සහ රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව මඟින් පිළිවෙළින් ප්‍රාග්ධන වැය ශීර්ෂයන් දෙකක් සඳහා වෙන්කොට තිබූ ප්‍රතිපාදනයෙන් මුළු එකතුව රු. 1,209,281 ක් එනම් සියයට 17 සිට සියයට 66 ක් දක්වා අපේක්ෂිත අරමුණට යොදා නොගෙන ඉතිරිව තිබුණි.

(ඇ) 2020/2021 කාල පරිච්ඡේදයේ දී කෝවිඩ් 19 විශේෂ දීමනා සඳහා සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව වෙතින් ලද ප්‍රතිපාදන අතරින් රු. 1,719,580 ක් අදාල ප්‍රතිලාභීන් වෙත පිරිනමා නොතිබුණි. කෙසේ වුවද මෙම ශේෂය නියමිත පරිදි මහා භාණ්ඩාගාරය වෙත ආපසු යැවීමට මේ දක්වා කටයුතු කර නොමැති අතර පිළිවෙළින් පුදුකුඩියිරුප්පු සහ වැලිඔය ප්‍රජා මූල බැංකුවල රඳවා තබා ඇත.

(ඈ) පුදුකුඩියිරුප්පු, උඩෙයාර්කට්ටු, ඔඩ්ඩුසුඩ්ඩාන් සමෘද්ධි ප්‍රජා මූල බැංකු සහ දිස්ත්‍රික් සමෘද්ධි සංවර්ධන කාර්යාලය ආදියෙහි පිළිවෙළින් ප්‍රතිලාභීන් 47 දෙනකු සඳහා පිරිනමා තිබූ ජීවනෝපාය සංවර්ධන ණය, ප්‍රතිචක්‍රීයකරණ ණය, ස්වයං රැකියා ණය, බෝග වගා කිරීමේ ණය සම්පූර්ණ එකතුව රු. 2,939,859 ක් ගෙවීගිය වර්ෂ 01 සිට 09 ක් දක්වා අයකර ගැනීමට විධිමත් පියවර නොගැනීම හේතුවෙන් මේ දක්වාම හිඟ ලෙස පවත්වාගෙන ගොස් ඇත.

(ඉ) පුදුකුඩියිරුප්පු, උඩෙයාර්කට්ටු සහ ඔඩ්ඩුසුඩ්ඩාන් සමෘද්ධි ප්‍රජා මූල බැංකුවල ප්‍රතිලාභීන් 6,163 කගේ වර්ග 05 ක බැංකු ගිණුම්වල ශේෂය රු. 26,299,722 ක් අක්‍රීය බැංකු ගිණුම් ශේෂ ලෙස සලකා ඇත. ඒවා සක්‍රීය බැංකු ගිණුම් බවට පත්කිරීමට මේ දක්වා විධිමත් පියවර ගෙන නොමැත.

## 2.3 නීති රීති, සීමාවන් සහ කළමනාකරණ තීරණයන්ට අනනුකූල වීම

පහත කරුණු අනාවරණය කර ගන්නා ලදී.

| නීති රීති, සීමාවන් සහ කළමනාකරණ තීරණ සමඟ වන සම්බන්ධතා | | වටිනාකම (රු.) | අනනුකූලතාවය |
|---|---|---|---|
| **(අ)** | **රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ** | | |
| (i) | වර්ෂ 2022 මාර්තු මස 08 වන දිනැති අංක 04/2022 දරන චක්‍රලේඛය | 7,391,394 | සමාලෝචිත වර්ෂයේ දී විදුලිබල පරිභෝජනය පාලනය කර අරපිරිමැස්මෙන් යුතුව භාවිතා නොකිරීම හේතුවෙන්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සහ මුහුදුබඩපත්තු, පුදුකුඩියිරුප්පු යන ප්‍රාදේශීය ලේකම් කාර්යාල මඟින් ජනවාරි මාසයේ සහ වාර්ෂික ප්‍රතිශතය සමඟ සැසඳීමේ දී දෙසැම්බර් මාසය දක්වා සියයට 14 සිට සියයට 172 දක්වා ප්‍රමාණවලින් විදුලිබල පරිභෝජන ඉහළ ගොස් තිබුණි. |
| (ii) | වර්ෂ 2009 අප්‍රේල් මස 16 වන දිනැති අංක 09/2009 දරන චක්‍රලේඛය | | සමාලෝචිත වර්ෂයේ දී මේ දක්වාම දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ක්‍රියාත්මක කර්මාන්ත දෙපාර්තමේන්තුව, දිස්ත්‍රික් හස්ත කර්මාන්ත සංවර්ධන අධිකාරිය සහ මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව යන ආයතනයන්හි සේවය කරන නිලධාරීන් 13 දෙනකු දෛනික |

| | | | |
|---|---|---|---|
| | | | පැමිණීම සහ පිටවීම ඇඟිලි සලකුණු යන්ත්‍රය මඟින් සටහන් කර නොතිබුණි. |
| (ආ | **<u>මුදල් රෙගුලාසි</u>** | | |
| | (i) අංක 66 | 1,913,457 | සමාලෝචිත වර්ෂයේ දී පුනරාවර්තන වැය විෂයයන් 03 ක් සඳහා වැය විෂයයන් හුවමාරු කිරීමේ ක්‍රමවේදය ලබාගෙන තිබූ ප්‍රතිපාදන අතරින් පිළිවෙළින් සියයට 6 සිට සියයට 40 දක්වා භාවිතයට නොගෙන ඉතුරුම් ලෙස රඳවා තිබුණි. |
| | (ii) අංක 115 (4) | | 2021 දෙසැම්බර් මස 31 වන දිනට අවසන් කර තිබූ කාර්යය බලකා පුනරුත්ථාපන (TFR) වැඩසටහනේ ප්‍රතිපාදන මඟින් ව්‍යාපෘති 43 ක් සඳහා වන ගෙවීම් ලෙස මුළු එකතුව රු. 12,995,502 ක් අදාල අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ අනුමැතිය ලබාගැනීමෙන් තොරව ඔට්ටුසුඩ්ඩාන් සහ පුදුකුඩියිරුප්පු ප්‍රාදේශීය ලේකම්වරුන් විසින් අනුමත කරන ලදුව සමාලෝචිත වර්ෂයේ දී ගෙවීම් කර තිබුණි. |
| (ඇ | **<u>ජනාධිපති ලේකම් කාර්යාලයේ චක්‍රලේඛ</u>**<br>වර්ෂ 2020 දෙසැම්බර් මස 15 වන දිනැති අංක PS/GPA/ Circular/29/2020 දරන චක්‍රලේඛයේ 02 සහ 03 ඡේද | | සමාලෝචිත වර්ෂයේ දී පාරිභෝගික සේවා අධිකාරියේ නිලධාරීන් 08 දෙනකු මහජන දිනය වන සඳුදා දින දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ රාජකාරියට වාර්තා කර නොතිබූ අවස්ථා 82 ක් නිරීක්ෂණය විය. |

| | | |
|---|---|---|
| (ඇ **<u>2006 වර්ෂයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය</u>**<br>3.4.3 (ඇ) වගන්තිය | 986,097 | සමාලෝචිත වර්ෂයේ දී ලියාපදිංචිව නොසිටි දීමනාකරුවන් 03 දෙනකුගෙන් ලිපිද්‍රව්‍ය සහ කාර්යාලීය උපකරණ මාන්තෙයි නැගෙනහිර සහ පුදුකුඩියිරුප්පු ප්‍රාදේශිය ලේකම් කාර්යාල විසින් ප්‍රසම්පාදනය කර තිබුණි. |
| (ඉ) **ජීවන නැගුම සමාජ ආරක්ෂණ චක්‍රලේඛ**<br>------------------------------------------------<br>වර්ෂ 2016 සැප්තැම්බර් මස 26 දිනැති අංක 2016/5 චක්‍රලේඛය | 7,246,500 | පුදුකුඩියිරුප්පු ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයේ ජීවත් වූ ජීවන නැගුම සමාජ ආරක්ෂණ අරමුදල් ප්‍රතිලාභී පවුල්වල අ.පො.ස. සාමාන්‍ය පෙළ විභාගයෙන් සමත්ව උසස් පෙළ අධ්‍යාපනය හදාරන සිසුන් 492 ක් වෙත මාස 41 ක් සඳහා ගෙවිය යුතු සිප්දොර ශිෂ්‍යාධාර දීමනා මේ දක්වාම ගෙවීම් සිදුකර නොමැත. |

## 2.4 අත්තිකාරම් ගෙවීම සහ නිරවුල් කිරීම

පහත කරුණු නිරීක්ෂණය විය

(අ) ගොවීන්ගෙන් වී මිලදී ගෙන අලෙවි කිරීම සඳහා දිස්ත්‍රික් ලේකම් කාර්යාලය මගින් කිසිදු ගිවිසුමකින් තොරව වී මිලදී ගැනීම සඳහා විවිධ සේවා සමූපකාර සමිති දෙකකට 2015 වර්ෂයේ දී ලබාදෙන ලද මුළු වටිනාකම රු. 20,729,785 ක වී මිලදී ගැනීමේ අත්තිකාරම් මුදලින් මුළු වටිනාකම රු. 14,659,125 ක් නැතහොත් 70% ක් නිරවුල් කිරීම සඳහා විධිමත් පියවර ගෙන නොතිබුනි.

(ආ) මුහුදුබඩපත්තු ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සේවය කරමින් සිට වැඩ තහනමට ලක්වූ සහ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සිට 2021 මාර්තු මස වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුවට ස්ථාන මාරු කරන ලද සංවර්ධන නිලධාරීන් දෙදෙනකුගෙන් අයකර ගත යුතුව තිබූ වර්ග දෙකක නිලධාරී ණය ශේෂයන් මුළු එකතුව රු. 250,159 ක් ගතවූ මාස 06 ක සිට වර්ෂ 03 ක කාලයක් දක්වා අය කර ගැනීමට විධිමත් පියවර ගෙන නොමැත.

## 2.5 තැන්පතු

විවිධ අමාත්‍යාංශ සහ දෙපාර්තමේන්තු මඟින් ලබා දී තිබූ මුළු එකතුව රු. 263,787 ක මුදලක් නියමිත අරමුණු සඳහා උපයෝජනය කිරීමෙන් තොරව වර්ෂ 01 කට අධික කාලයක් තිස්සේ පොදු තැන්පතු ගිණුමෙහි රඳවා තබා තිබුණි. **මෙහෙයුම් සමාලෝචනය**

## 2.3 කාර්ය සාධනය

## 3.1.1 අපේක්ෂිත නිමැවුම් හිමිකර නොගැනීම

රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා සහ පළාත් පාලන ආයතන අමාත්‍යාංශය මඟින් ලබා දී තිබූ මූල්‍ය ප්‍රතිපාදන යොදා ගනිමින් 2016 වර්ෂයේ දී පුදුකුඩියිරුප්පු ප්‍රදේශීය ලේකම් කාර්යාලය මඟින් මුළු එකතුව රු. 657,500 ක වියදමින් ලබාගත් කිලෝවොට් 05 සූර්ය බල විදුලි උත්පාදන පද්ධතියෙන් මසකට කිලෝවොට් පැය 432 ක විදුලි උත්පාදනයක් අපේක්ෂා කළද එම පද්ධතිය මඟින් උත්පාදනය කළ සමස්ත විදුලිය ප්‍රමාණය සහ ලංකා විදුලිබල මණ්ඩලය වෙතින් ලද ආදායම / මාසිකව උත්පාදනය කරන ලද විදුලිය ප්‍රමාණය භාවිතා කරන ලද ක්‍රමවේදය යන කරුණු ගතවූ වර්ෂ 7 ක කාලයක් තිස්සේ ලැබී නොමැති බැවින් මෙම ව්‍යාපෘතියෙන් අපේක්ෂිත නිමැවුම් සමඟ සංසන්දනය කර පරීක්ෂා කර තහවුරු කර ගැනීමට නොහැකි විය.

## 3.2 අවිධිමත් ගෙවීම්

පහත කරුණු නිරීක්ෂණය විය

(අ) සමාලෝචිත වර්ෂයේ දී පූර්ව දැනුම් දීමකින් තොරව සේවයට වාර්තා නොකළ සමෘද්ධි සංවර්ධන නිලධාරීන් 04 දෙනකු සඳහා ඔවුන් සේවයට වාර්තා නොකළ කාල පරිච්ඡේදය සඳහා පුද්ගලික වේතන (Personnel Emoluments) ලෙස රු. 331,235 ක මුදලක් මුලතිව් දිස්ත්‍රික් සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තු කාර්යාලය මඟින් ගෙවීම් කර තිබුණි. කෙසේ වුවද ඒවා අදාළ අයවළුන්ගෙන් නැවත අයකර ගැනීම සඳහා මේ දක්වා විධිමත් පියවර ගෙන නොමැත.

(ආ) ඉඩම් රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ රාජකාරී කටයුතු ඉටුකිරීම සඳහා ඔට්ටුසුඩ්ඩාන් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සේවයේ නිරතව සිටි එක් සංවර්ධන නිලධාරියකු 2022 මාර්තු 03 දින සිට 2022 ඔක්තෝබර් 31 දින දක්වා අනුමැතියකින් තොරව සේවයට වාර්තා නොකර සිටීම පිළිබඳව අදාළ ප්‍රාදේශීය ලේකම්වරයා විසින් ඉඩම් රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා වෙත නියමිත කාලසීමාව තුළ දී දැනුම් නොදීම හේතුවෙන් එම නිලධාරියා වෙත ඉහත කාලසීමාව සඳහා මුළු එකතුව රු. 381,440 ක් වේතන ලෙස ගෙවීමට කටයුතු කර තිබුණි.

## 3.3 රථවාහන භාවිතය

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ කටයුතු සඳහා දිස්ත්‍රික් සංඛ්‍යාලේඛන ශාඛාව වෙත සමාලෝචිත වර්ෂයේ දී ලබා දී තිබූ වාහනයක් රු. 200,000 ක් වැය කර අලුත්වැඩියා කිරීමෙන් පසුව භාවිතයට නොගෙන මාස 09 ක් තිස්සේ දිස්ත්‍රික් ලේකම් කාර්යාල වාහන අංගනයේ ගාල් කොට තිබුණි.

## 3.4 වත්කම් කළමනාකරණය

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ දෙවන මහලේ සංඛ්‍යාලේඛන ශාඛා කාර්යාලයේ කටයුතු පවත්වාගෙන ගිය වෙන් කළ කොටස සහ බිම් මහලේ අලුතෙන් වෙන්කර සකස් කළ කාර්යාල කාමර දෙකක් සම්පූර්ණ කර තිබුණ ද මේ දක්වාම අපේක්ෂිත අරමුණු සඳහා භාවිතයට නොගෙන අතහැර දමා තිබුණි.

## 3.5 බල රහිත ගෙවීම්

පහත කරුණු අනාවරණය විය

(අ) ජාතික ආධුනිකත්ව හා වෘත්තීය පුහුණු අධිකාරියේ (VTA) පුහුණුවන්නන් සඳහා පුහුණු කාලසීමාව සඳහා වන ගෙවීම් වාර්ෂික වැය ඇස්තමේන්තුවේ අනුමත කර නොතිබුණි. කෙසේ වුවද මේ සඳහා 2021 සිට 2023 දක්වා කාල පරිච්ඡේදයේ දී දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ අනෙකුත් දීමනා (Other Allowance – 1003) සඳහා වෙන්කොට තිබූ මුදල් ප්‍රතිපාදන භාවිතා කරමින් මුළු එකතුව රු. 3,349,250 ක ගෙවීම් සිදුකර තිබුණි.

(ආ) දිස්ත්‍රික් සමෘද්ධි කාර්යාලයේ ගණකාධිකාරී තනතුර සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතියකින් තොරව දිස්ත්‍රික් ලේකම්වරයා විසින් පුදුකුඩියිරුප්පු ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ගණකාධිකාරීවරයා වෙත 2019 මැයි 07 වන දින වැඩබලන පත්වීමක් ලබා දෙමින් 2019 මැයි 08 වන දින සිට 2023 මැයි මාසය දක්වා කාල පරිච්ඡේදය සඳහා මුළු එකතුව රු. 667,337 ක මුදලක් දීමනා ලෙස ගෙවීම් කර තිබුණි.

## 3.6 ක්‍රියාත්මක කිරීමේ දුර්වලතා

පහත කරුණු අනාවරණය විය

(අ) පොදු ජනතාවට පිරිනමා තිබූ ඉඩම්වල වටිනාකම් ඇස්තමේන්තු කිරීමට ගතවූ වසර 05 ක් තිස්සේ තුනුක්කායි ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ඉඩම් කොමසාරිස් ජනරාල්, උතුරු පළාත් ඉඩම් කොමසාරිස් ආදී නිලධාරීන් සමඟ ඒකාබද්ධව ක්‍රියාත්මක කළ යුතුව තිබූ පසු විපරම් කටයුතු සිදු නොවිය. මේ හේතුවෙන් අයවිය යුතු බදු මුදල් නියමිත කාලයේ දී අයකර ගැනීමට නොහැකිව ඇති අතර විවිධ පාර්ශව විසින් රජයේ ඉඩම් අනවසරයෙන් විවිධ වපසරියන්ගෙන් භාවිතා කරන බව අවධාරණය විය.

(ආ) උතුරු පළාත් ඉඩම් පරිපාලන දෙපාර්තමේන්තුව මඟින් පත්කර තිබූ ජනපද නිලධාරි විසින් හඳුනාගෙන තිබිය යුතු වූ තුනුක්කායි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ පිහිටි රජයේ ඉඩම් හරියාකාරව පරීක්ෂා කර හඳුනාගෙන තහවුරු කරගැනීමට ගතවූ වර්ෂ 15 ක කාලයක් තිස්සේ විධිමත් පියවර ගෙන නොමැත. තවද, රජයේ ඉඩම් හරියාකාරව හඳුනාගෙන ලියාපදිංචි කර වර්ෂ 1947 අංක 08 දරන රජයේ ඉඩම් ආඥාපනත ප්‍රකාරව පියවර ගෙන මහජනතාවගේ භාවිතයට උපරිම ලෙස භාවිතා කිරීමට ගත යුතු පියවර අධීක්ෂණය කොට මඟපෙන්වීම සඳහා තුනුක්කායි ප්‍රාදේශීය ලේකම්වරයා විසින් මේ දක්වාම කටයුතු කිරීමට අපොහොසත්ව ඇත.

(ඇ) ඉඩම් අවසර පත්‍ර ලබා දී තිබූ ප්‍රතිලාභීන්ගේ වර්තමාන ජීවන තත්වය, එම ඉඩම්වල වර්තමාන තත්වය ආදිය පරීක්ෂා කර බලා කලින් කලට සමාලෝචනයට ලක් කිරීමට ඉඩම් නිලධාරින් මාර්ගයෙන් ප්‍රාදේශිය ලේකම්වරුන් විසින් කටයුතු නොකිරීම හේතුවෙන් එම ඉඩම් ඵලදායී ලෙස භාවිතය, පසු උරුමකරුවන් ක්‍රියාත්මක කිරීම, නැවතත් ඉඩම් කච්චේරි හරහා ක්‍රියාත්මක කිරීම, ඒ සම්බන්ධ ගැටළු විසඳීම වැනි

කාර්යයන්හිදී මුහුදුබඩපත්තු සහ තුනුක්කායි ප්‍රාදේශීය ලේකම් කාර්යාලයන්හි මන්දගාමී ක්‍රියාකාරීත්වයක් නිරීක්ෂණය විය.

(ඇ) මාන්තෙයි නැගෙනහිර ප්‍රාදේශීය ලේකම් කාර්යාල බල ප්‍රදේශයේ පාර්ශව 67 ක් වෙත දීර්ඝ කාලීන බදු පදනම මත 2021 – 2023 වර්ෂ දක්වා කාල පරිච්ඡේදය තුළ ඉඩම් පරිහරණ කමිටුවේ තීරණ ප්‍රකාරව ඉඩම් පිරිනැමීමට තීරණය කොට තිබුණද මේ දක්වාම අදාළ වටිනාකම් ඇස්තමේන්තු කර ආදායම් අයකර ගැනීමට විධිමත් පියවර ගෙන නොතිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයේ දී සහ එයට පෙර වර්ෂයේ දී මුහුදුබඩපත්තු ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මඟින් ආබාධිත අයවළුන්, වකුගඩු රෝගීන්, වයස අවුරුදු 70 ට වැඩි අයවළුන්, වයස අවුරුදු 100 ට වැඩි අයවළුන් ආදී තෝරගෙන තිබූ ප්‍රතිලාභීන් 154 දෙනකුට පිරිනැමිය යුතුව තිබූ දීමනාවන් මුළු එකතුව රු. 2,788,300 ක් සමාජ සේවා දෙපාර්තමේන්තුව මඟින් නිදහස් නොකිරීම හේතුවෙන් ප්‍රතිලාභීන් වෙත ගෙවා නොතිබුණි.

### 3.7 කළමනාකරණ දුර්වලතා

පහත කරුණු නිරීක්ෂණය විය

(අ) ජනපද නිලධාරී විසින් 2019 වර්ෂයේ දී හඳුනාගන්නා ලදුව ඉඩම් කොමසාරිස් ජනරාල්වරයාගේ අංක 2021/02 හා 2022 ඔක්තෝබර් 22 දිනැති චක්‍රලේඛයට අනුව පත්කරන ලද තුනුක්කායි ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ කාරක සභාව මඟින් තීරණය කර තිබූ වටිනාකම් ඇස්තමේන්තුවට අනුව, වැඩිදුරටත් ඉඩම් කොමසාරිස් ජනරාල්වරයාගේ අංක 2018/02 හා 2018 මාර්තු 28 දිනැති චක්‍රලේඛයට අනුව අයකරගත යුතුව තිබූ රජයේ ඉඩම් 19 කට අදාළ මුළු එකතුව රු. 3,268,790 ක බදු

මුදල් ගතවූ වර්ෂ 01 සිට 05 දක්වා කාලයක් තිස්සේ අයකර ගැනීමට විධිමත් පියවර ගෙන නොතිබුණි.

(ආ) තුනුක්කායි ප්‍රදේශීය ලේකම්වරයා විසින් 2014 වර්ෂයේ දී ප්‍රතිලාභියකු වෙත තාවකාලික බදු පදනම මත ලබාදී තිබූ අක්කර 29 ක වපසරියෙන් යුත් රජයේ ඉඩම සඳහා මේ වන විට අය විය යුතු රු. 1,480,000 ක බදු මුදල මේ දක්වාම අයකර ගෙන නොතිබුණි.

## 3.8 <u>නියමිත අරමුණ සඳහා යොදා නොගන්නා ලද ප්‍රතිපාදන</u>

පහත කරුණු නිරීක්ෂණය විය

(අ) ජාතික නිවාස සංවර්ධන අධිකාරිය සහ ග්‍රාමීය නිවාස ඉදිකිරීම් සහ ගොඩනැගිලි ද්‍රව්‍ය කර්මාන්ත සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය මඟින් විවිධ අවස්ථාවලදී ප්‍රතිලාභීන් 98 දෙනකුට පිරිනමන ලද නිවාස ව්‍යාපෘති සඳහා වන දීමනා රු. 13,405,280 ක් සුදුසු ප්‍රතිලාභීන් වෙත පිරිනැමීමෙන් තොරව පුදුකුඩියිරුප්පු, ඔට්ටුසුඩ්ඩාන් සහ උඩයාර්කට්ටු සමෘද්ධි බැංකු ගිණුම්වල වර්ෂ 01 සිට 04 දක්වා කාලයක් තිස්සේ අදාළ අරමුණු සඳහා භාවිතයට නොගෙන රඳවා තබා තිබුණි.

(ආ) සමෘද්ධි ජීවනාධාර දීමනා ලබාගත් ප්‍රතිලාභීන් 135 දෙනකුගේ ගිණුම් ශේෂයන් රු. 32,106 සිට රු. 175,749 දක්වා පරාසයක් තුළ මුළු එකතුව රු. 8,443,715 ක ආධාර මුදලක් ජීවනාධාර අරමුණු සඳහා භාවිතා නොකර ප්‍රතිලාභීන්ගේ සමෘද්ධි බැංකු ගිණුම්වල රඳවා ඇති බවට නිරීක්ෂණය විය.

# <u>4 තිරසර සංවර්ධනය</u>

## 4.1 <u>තිරසර සංවර්ධන ඉලක්ක හඳුනා ගැනීම</u>

2017 වර්ෂයේ අංක 01 දරන තිරසර සංවර්ධන පනතට අනුව තිරසර සංවර්ධන ඉලක්ක 2030 වර්ෂයේදී සපුරා ගැනීමේ අරමුණින් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල මඟින් වාර්ෂිකව සපුරාගත යුතු ඉලක්ක, එම ඉලක්ක සපුරා ගැනීම සඳහා ක්‍රියාත්මක කළ යුතු කරුණු සහ ඒවායේ ප්‍රගතිය මැන බැලීම සඳහා වන උපදෙස් ආදිය වසර 06 ක් තිස්සේ හඳුනාගෙන ක්‍රියාත්මක කිරීම සඳහා වන පියවර ගෙන නොමැත.

# 5 යහපාලනය

## 5.1 මහජනතාව සඳහා වන සේවාවන් ඉටුකිරීම

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ විවිධාකාර සේවා සපයනු ලබන ස්ථාන / මහජනතාවට පහසුවෙන් ඒකකයන් හඳුනාගෙන එම සේවාවන් ලබාගත හැකි පරිදි වන ඇතුල්වීමේ ප්‍රධාන දොරටුව / මහජනතාවට සේවාවන් ලබා ගැනීම සඳහා දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට ඇතුල් වන ප්‍රධාන දොරටුව අසල ප්‍රදර්ශනය කළ යුතු කාර්යාලයේ බිම් සැලැස්ම ප්‍රදර්ශනය කර නොතිබීම සහ සේවාලාභී ප්‍රඥප්තිය බිම් මහලේ හුදෙකලා ස්ථානයක ප්‍රදර්ශනය කර තිබීම හේතුවෙන් සේවාලාභීන් අදාල සේවා ස්ථාන මෙන්ම තොරතුරු දැන ගැනීමේ දී ද විවිධ අසීරුතාවයන්ට මුහුණ දෙන අවස්ථා නිරීක්ෂණය කරන ලදී.

# 6 මානව සම්පත් කළමනාකරණය

**පහත කරුණු අනාවරණය විය.**

(අ) මාන්තෙයි නැගෙනහිර, වැලිඔය, ඔට්ටුසුඩ්ඩාන්, තුනුක්කායි සහ පුදුකුඩියිරුප්පු ප්‍රාදේශීය ලේකම් කාර්යාලයන්හි පිළිවෙළින් සහකාර ප්‍රදේශීය ලේකම් තනතුරු 02 ක්, ගණකාධිකාරී තනතුරු 02 ක්, පරිපාලන නිලධාරී තනතුරු 05 ක් සහ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ඉංජිනේරු තනතුර සඳහා වන පුරප්පාඩු වසර 01 සිට 10 දක්වා කාලයක් පුරා සම්පූර්ණ කිරීමට විධිමත් පියවර ගෙන නොමැති බැවින් මූල්‍ය, පරිපාලන, සංවර්ධන ව්‍යාපෘති කටයුතුවලට බලපෑම් සිදුව ඇත.

(ආ) කාර්මික සහකාර නිලධාරීන් සඳහා වාර්ෂික ස්ථාන මාරු ලබා නොදීම හේතුවෙන් එවන් නිලධාරීන් 06 දෙනකු හට ගතවූ වසර 05 සිට 09 දක්වා කාලයක් තිස්සේ මෙම දිස්ත්‍රික්කයේ එක් නිශ්චිත සේවා ස්ථානයක පමණක් රාජකාරියේ නිරතව සිටීමට ඉඩ සලසා ඇත. කෙසේ වුවද සමාලෝචිත වර්ෂයේ දී මෙම ස්ථාන මාරු කිරීම් සඳහා අදාළ අමාත්‍යාංශය විසින් ඉල්ලුම්පත් කැඳවා තිබුණ ද ඒ සඳහා අවශ්‍ය කටයුතු කිරීමකින් තොරව සිට ඇත.

(ඇ) වැලිඔය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ප්‍රාදේශීය ලේකම්වරයා ලෙස සේවයේ නියුතු ශ්‍රී ලංකා පරිපාලන සේවයේ පළමු ශ්‍රේණියට අයත් නිලධාරියා ගතවූ වසර 10 ක් තිස්සේ ස්ථාන මාරු නොලැබ එකම සේවා ස්ථානයක රාජකාරි කිරීම සඳහා රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා සහ පළාත් පාලන ආයතන අමාත්‍යාංශය මඟින් අනුමැතිය ලබා දී තිබුණි.

(ඇ) දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ගණකාධිකාරීවරයෙක් දිස්ත්‍රික් සමෘද්ධි සංවර්ධන කාර්යාලයේ වැඩබලන ගණකාධිකාරීවරයා ලෙස දිස්ත්‍රික් ලේකම්වරයා විසින් පත්කරන ලදුව 2023 වර්ෂයේ ජූලි මස 19 වන දින සිට රාජකාරියේ නිරතව සිටී. කෙසේ වුවද රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙතින් ලබාගත යුතු වැඩබලන පත්වීම සඳහා වන අනුමැතිය මේ දක්වාම ලබාගෙන නොතිබුණි.

පී. පට්කුනන්
ජ්‍යෝෂ්ඨ සහකාර විගණකාධිපති
විගණකාධිපති වෙනුවට

# 04 වන පරිච්ඡේදය

## කාර්ය සාධන දර්ශක

### ආයතනයේ කාර්ය සාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

| නිශ්චිත දර්ශක | ලබාගත් නිමැවුම අපේක්ෂිත නිමැවුමෙහි ප්‍රතිශතයක් (%) ලෙස | | |
|---|---|---|---|
| | 100 - 90 | 75 - 89 | 50 - 74 |
| නිවාස පහසුකම් ලබාදීම | ✓ | | |
| ගෙවතු සකස් කිරීම | ✓ | | |
| සෞඛ්‍ය සේවා වැඩිදියුණු කිරීම | ✓ | | |
| පන්ති කාමර අළුත්වැඩියාව | ✓ | | |
| මත්ද්‍රව්‍යවලට ඇබ්බැහිවූවන් පුනරුත්ථාපනය | ✓ | | |
| කුඩා සහ මධ්‍ය පරිමාණ කර්මාන්ත 49 ක් ආරම්භ කිරීම | ✓ | | |
| පෝෂණ තත්වයන් වර්ධනය කිරීම | ✓ | | |

# 05 වන පරිච්ඡේදය

## තිරසාර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය

### 5.1 හඳුනාගත් තිරසර සංවර්ධන අරමුණු පිළිවෙලින් දක්වන්න

| අභිමතාර්ථ / අරමුණ | ඉලක්කය | ජයග්‍රහණ දර්ශක | ප්‍රගතිය | | |
|---|---|---|---|---|---|
| | | | 0-49 | 50-74 | 75-100 |
| 1. දරිද්‍රතාව තුරන් කිරීම | 2030 වර්ෂයේ දී පමණ සියළු ජනතාව දරිද්‍රතාවයෙන් මුදවා ගැනීම | ආර්ථික ගැටළු හේතුවෙන් බලපෑමට ලක්ව ඇති පවුල් 273 ක් සවිබල ගැන්වීම | | | ✓ |
| 2. කුසගිනි නොමැතිවීම | සැමට ආහාර | ගෙවතු 2144 ක් ආරම්භ කර ඇත. | | | ✓ |
| 3. යහපත් සෞඛ්‍ය සහ යහපැවැත්ම | මත්ද්‍රව්‍ය භාවිතය සහ අන්තරාකාරී මත්ද්‍රව්‍ය භාවිතයෙන් මුදවා ගැනීම | මත්ද්‍රව්‍යයන්ට ඇබ්බැහිවූවන් 37 දෙනකු පුනරුත්ථාපනය කර නැවත සමාජගත කර ඇත. | | | ✓ |
| | 2030 වර්ෂයේ දී පමණ වාර්ෂික මාතෘ මරණ අනුපාතය 10000 කට 70 කට වඩා අඩු මට්ටමකට ගෙන ඒම. | අඩු ආදායම්ලාභී ගැබිණි මවුවරුන් 321 ක් වෙත දරුවන් ප්‍රසූතිය තෙක් පෝෂණ ආහාර ලබා දී ඇත. | | | ✓ |
| | 2030 වර්ෂයේ දී පමණ වයස අවුරුදු 5 ට අඩු දරුවන්ගේ මරණ අනුපාතය අවම කිරීම | අඩු ආදායම්ලාභී පවුල්වලට අයත් දරුවන් 265 ක් සඳහා පෝෂණ ආහාර ලබා දී ඇත. | | | ✓ |
| 4. ගුණාත්මක අධ්‍යාපනය | 2030 වර්ෂයේ දී පමණ ගැහැණු පිරිමි සියලුම දරුවන් සඳහා සමාන ප්‍රාථමික සහ ද්විතීයික අධ්‍යාපනයක් තහවුරු කිරීම. | පාසැල් යා යුතු වයසේ පසුවන නමුත් පාසැල් හැරගිය දරුවන් 141 දෙනකු නැවත පාසැල් කරා යොමුකොට ඇත. | | | ✓ |
| 5. ස්ථාවර ආර්ථික වර්ධනය දිරිමත් කිරීම | නිෂ්පාදන කටයුතු වර්ධනය සඳහා උපකාරීවන ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම. | කුඩා සහ මධ්‍ය පරිමාණ කර්මාන්ත ව්‍යාපෘති 40 ක් ආරම්භ කර ඇත. | | | ✓ |
| | | කුඩා සහ මධ්‍ය පරිමාණ කර්මාන්ත හෝ කෘෂි ආශ්‍රිත අපනයන ව්‍යාපෘති 40 ක් ආරම්භ කර ඇත. | | | ✓ |
| 7. තිරසර නගර සහ ප්‍රජාවන් | 2030 වර්ෂයේ දී පමණ සැමට ප්‍රමාණවත් ආරක්ෂාකාරී සහ සාධාරණ මිලකින් යුත් නිවාස සහ යටිතල පහසුකම් හිමිවීම තහවුරු කිරීම. | නිවාස 18 ක් ඉදිකර ඇත | | | ✓ |
| 7. දේශගුණ විපර්යාස සහ ඉන් ඇතිවන බලපෑම් දුරලීම සඳහා කඩිනම් පියවර ගැනීම. | දේශගුණය සම්බන්ධ ආපදා සහ ස්වභාවික විපත්වලින් මිදීම සඳහා වන හැකියාවන් වර්ධනය | ව්‍යාපෘති 13 ක් ක්‍රියාත්මක කර ඇත. | | | ✓ |

## 5.2 තිරසර සංවර්ධන ඉලක්ක සපුරාගැනීමේ ලා වන ජයග්‍රහණ සහ අභියෝග කෙටියෙන් පැහැදිලි කරන්න

- ආර්ථික ගැටළු සහ ප්‍රාදේශීය නිෂ්පාදන සඳහා සුදුසු මිලක් නොලැබීම හේතුවෙන් පසුගිය වර්ෂයන් සමඟ සැසඳීමේ දී අපගේ ඉලක්කයන් සපුරාගත නොහැකි විය. එසේ වුවද රජයේ සහ අනෙකුත් පාර්ශවයන්ගේ මූල්‍ය දායකත්වය සහිතව ඇතැම් ඉලක්ක සපුරාගෙන ඇත.

- කාලගුණය ආශ්‍රිත අනතුරු සහ ස්වභාවික විපත්වලින් මිදීම සහ යළි නැගී සිටීම සඳහා වන හැකියාවන් සවිබල ගැන්වීම.

# 06 වන පරිච්ඡේදය

## මානව සම්පත් පැතිකඩ

### 6.1 සේවක කළමනාකරණය

| මට්ටම | අනුමත සේවක සංඛ්‍යාව | දැනට සිටින සේවක සංඛ්‍යාව | පුරප්පාඩු | අතිරික්ත |
|---|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ | 37 | 27 | 10 | |
| තෘතීයික | 28 | 7 | 21 | |
| ද්විතීයික | 563 | 535 | 264 | 238 |
| ප්‍රාථමික | 75 | 40 | 32 | |
| එකතුව | **703** | **609** | **327** | **238** |

### 6.2 **මානව සම්පත් හිඟය ආයතනයේ කාර්ය සාධනය කෙරෙහි පහත ආකාරයට බලපෑම් සිදුවේ.**

1. නිලධාරීන්ට අධික රාජකාරි ප්‍රමාණයක් ඉටු කිරීමට සිදුවීම හේතුවෙන් ඔවුන් හට සේවය පිළිබඳව තෘප්තිමත් භාවයක් නොලැබෙන බැවින් ඔවුන් සේවය කෙරෙහි දක්වන උනන්දුව හීනවේ. මෙය ආයතනයේ ඉලක්ක සපුරා ගැනීමේදී බලපෑම් ඇති කරයි.

2. දෙවන පෙළ නිලධාරීන්ගේ සමස්ත අතිරික්තයත් නිරීක්ෂණය වුවද එම පෙළෙහිම එක් ශ්‍රේණියක පවතින පුරප්පාඩුවල රාජකාරි සඳහා අතිරික්ත ශ්‍රේණියේ නිලධාරීන් යෙදවීම හේතුවෙන් ද ගැටළුවලට මුහුණ පෑමට සිදුව ඇත. තවද මානව සම්පත් හිඟය හේතුවෙන් අනෙකුත් නිලධාරීන් මත අධික වැඩ කොටසක් පැවරී ඇති බැවින්,

    1. මානසික ආතතිය ඇතිවීම
    2. නිසි කාල සීමාවකට අනුව කටයුතු ඉටු කළ නොහැකි වීම
    3. ජනතාව වෙත කඩිනම් සේවාවක් සැපයීම කෙරෙහි බාධා ඇතිවීම

    මෙම හේතූන් මත ආයතනයේ ඉලක්ක සපුරාගැනීමට නොහැකි වන අතරම මෙම නිසා ආයතනයේ වර්ධනයට ද බලපෑම් ඇතිවේ.

එමෙන්ම, මානව සම්පත් අතිරික්තයක් පැවතීම හේතුවෙන් අතිරික්ත සේවකයින්ගේ වැටුප් ගෙවීම ඇතුළු අනෙකුත් සියළුම වියදම් සඳහා වන ඇස්තමේන්තු මඟින් ආයතනයේ ආදායමට අහිතකර බලපෑම් ඇතිවන අතරම අතිරික්ක සේවක පිරිස් හේතුවෙන් ආයතන තුල රාජකාරී

කටයුතුවලදී අනවශ්‍ය මතභේදාත්මක තත්වයන්ද ඇතිවේ. තවද එය ආයතනයේ කීර්ති නාමයට හානිකර වන අතරම ආයතනයේ කාර්ය සාධනයට අහිතකර බලපෑමක් ඇති කරයි.

## 6.3 මානව සම්පත් සංවර්ධනය

| වැඩ සටහනේ නම | පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව | වැඩ සටහනේ කාල සීමාව | සමස්ථ ආයෝජනය (රු.) | | වැඩ සටහනේ ස්වභාවය (දේශීය / විදේශීය) | ලබා ගත් දැනුම |
|---|---|---|---|---|---|---|
| | | | දේශීය | විදේශීය | | |
| දුම්රිය ගමන් බලපත්‍ර සහ දේශීය සේවාවන් | 25 | 2023-07-18 | 14,300.00 | | දේශීය | දුම්රිය ගමන් බලපත්‍ර පිළිබඳ දැනුම |
| නිවාඩු | 25 | 2023-07-18 | 15,000.00 | | දේශීය | නිවාඩු පිළිබඳ දැනුම |
| විනය කාර්යය | 25 | 2023-07-19 | 15,700.00 | | දේශීය | විනය කාර්යය |
| දුම්රිය ගමන් බලපත්‍ර සහ දේශීය සේවාවන් | 25 | 2023-07-19 | 13,000.00 | | දේශීය | දුම්රිය ගමන් බලපත්‍ර පිළිබඳ දැනුම |
| නිවාඩු | 25 | 2023-07-20 | 13,500.00 | | දේශීය | නිවාඩු පිළිබඳ දැනුම |
| විනය කාර්යය | 25 | 2023-07-20 | 14,460.00 | | දේශීය | විනය කාර්යය |
| රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්යය පටිපාටි | 61 | 2023-11-21 | 15,650.00 | | දේශීය | කොමිෂන් සභාව පිළිබඳ දැනුම |
| කාර්යාල ක්‍රම | 65 | 2023-11-22 | 14,500.00 | | දේශීය | කාර්යාල ක්‍රම |
| කාර්යාල කළමනාකරණය | 65 | 2023-11-23 | 14,750.00 | | දේශීය | කාර්යාල කළමනාකරණය |
| ආයතන සංග්‍රහය | 65 | 2023-11-24 | 14,900.00 | | දේශීය | ආයතන සංග්‍රහය |
| පරිගණක උපාංග භාවිතය | 45 | 2023-12-22 | 27,120.00 | | දේශීය | පරිගණක පිළිබඳ දැනුම |
| කාර්යාල කළමනාකරණ ක්‍රම | 45 | 2023-12-22 | 27,120.00 | | දේශීය | කළමනාකරණ ක්‍රම |
| කාර්යාල ක්‍රම සහ සැලසුම් සකස් කිරීම | 55 | දින 2 යි | 19,650.00 | | දේශීය | කාර්යාල ක්‍රම සහ සැලසුම් සකස් කිරීම සම්බන්ධ දැනුම |
| ගිණුම් ක්‍රම, කාර්යාල ක්‍රම සහ පරිගණක භාවිතය | 55 | දින 2 යි | 19,650.00 | | දේශීය | ගිණුම් ක්‍රම, කාර්යාල ක්‍රම සහ පරිගණක භාවිතය පිළිබඳ දැනුම |
| අජීවිතා ශාස්ත්‍රපති | 1 | | 157,000.00 | | දේශීය | |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| උපාධිය (ව්‍යාපාර) කැලණිය විශ්ව විද්‍යාලය | | | | | | |
| අල්ලස් දූෂණය සම්බන්ධව දැනුවත් කිරීමේ පුහුණු වැඩසටහන | 60 | 2023-12-06 (පැය 3 යි) | 11,400.00 | | දේශීය | කාර්යාල කාර්ය මණ්ඩලය සහ කොට්ඨාශ කාර්ය මණ්ඩලය අල්ලස් දූෂණය සම්බන්ධ සම්ප්‍රජානනය සහ දැනුම ලබා ගනිමින් ග්‍රාමීය මට්ටමේ නිලධාරීන් අල්ලස් දූෂණය සම්බන්ධ සම්ප්‍රජානනය ජනතාව කරා ගෙන යාම. |
| මූල්‍ය රෙගුලාසි, ආයතන සංග්‍රහය සම්බන්ධ රජයේ ක්‍රියා පටිපාටි | 60 | 2023-12-12 (පැය 6 යි) | 21,600.00 | | දේශීය | නිලධාරීන් විසින් ආයතනයට ලැබෙන ප්‍රතිපාදන මූල්‍ය රෙගුලාසීන්ට අනුව වගකීම් සහිතව භාවිතා කිරිම පිළිබඳ අමතර දැනුමක් ලබාගත් අතර කාර්යාල කටයුතු ආයතන සංග්‍රහයට අනුකූලව ක්‍රියාත්මක කිරිම පිළිබඳව ද දැනුවත් වූහ. |
| ඵලදායීතාව පිළිබඳ නිරීක්ෂණ චාරිකාව | 50 | 2023-12-19 (දින 1 යි) | 80,000.00 | | දේශීය | ජාතික මට්ටමින් ඵලදායිතා විශිෂ්ඨත්ව තරඟයෙන් ප්‍රථම ස්ථානය ලද කාර්යාල වෙත නිරීක්ෂණ චාරිකාවවල යෙදීම මඟින් දැනටමත් ජාතික මට්ටමින් ඵලදායිතා විශිෂ්ඨත්ව තරඟයෙන් දෙවන ස්ථානය ලද කාර්යාලය ලෙස තවදුරටත් ඵලදායිතාව පිළිබඳ දැනුම, ක්‍රමවේද, ඊ- ඵලදායිතාවය පිළිබඳ දැනුම වර්ධනය වූ අතර දැනටමත් එය අපගේ කාර්යාලයේ ක්‍රියාවට නංවා ඊ- ඵලදායිතාවය වර්ධනය කිරීමේ අරමුණින් අප කාර්යාලයේ නිලධාරියකු විසින් මෘදුකාංගයක් සකස් කරනු ලදුව එය සාර්ථක වී ඇත. |
| ඵලදායීතාව පිළිබඳ පුහුණු වැඩසටහන | 70 | 2023-12-21 (පැය 6 යි) | 35,000.00 | | දේශීය | නිලධාරීන් තුළ ඵලදායීතාව සම්බන්ධ ක්‍රමවේද, ආකල්ප පිළිබඳ අමතර දැනුම වර්ධනය වූ අතර එය රාජකාරී කටයුතුවල දී භාවිතා කරමින් පහසු ලෙස කටයුතු කිරීමේ දැනුම ලබා ගත්හ. (ඊ- ඵලදායිතාවය, හරිත ඵලදායිතාවය තත්ව |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | | | | | | වර්ධන උපකරණ, නිර්මාණශීලීත්වය සහ නව්‍යකරණ ක්‍රියාකාරකම්) |
| ඵලදායීතාව, කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ, තනතුරු උසස්වීම් සඳහා මඟපෙන්වීම වැනි කරුණු සම්බන්ධ පුහුණු වැඩසටහන | 90 | පැය 6 යි | 70,890.00 | | දේශීය | මූල්‍ය රෙගුලාසි, ආයතන සංග්‍රහය සහ ඵලදායීතාව පිළිබඳ දැනුම |
| අල්ලස් දූෂණය පිළිබඳ පුහුණු වැඩසටහන | 50 | පැය 6 යි | 41,050.00 | | දේශීය | අල්ලස් දූෂණය පිළිබඳ දැනුම |
| පළමුවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය සඳහා සූදානම් වීම - සංවර්ධන නිලධාරීන් | 80 | දින 12 යි 14, 15, 16, 17, 21, 22, 23, 24, 28.02.2023 01,02,03.03 .2023 | 52,400.00 | | දේශීය | ආයතන සංග්‍රහය, මූල්‍ය රෙගුලාසි සහ තොරතුරු තාක්ෂණය පිළිබඳ දැනුම |
| රාජ්‍ය කළමනාකරණ සේවයේ පළමුවන ශ්‍රේණියේ නිලධාරීන් සඳහා කාර්යක්ෂමතාක ඩඉම් පංතිය | 10 | දින 10 යි 08, 09, 10, 11, 12,.05.2023 15, 16, 17, 18, 19.05.2023 | 71,400.00 | | දේශීය | ආයතන සංග්‍රහය, මූල්‍ය රෙගුලාසි සහ කාර්යාල ක්‍රම පිළිබඳ දැනුම |
| ස්වයං සහ සමාජීය සංකලනයන් සහ අන්තරාවලෝ-කනය – යෝගා පුහුණුව | 50 | දින 2 යි 11.07.2023 12.07.2023 | 5,400.00 | | දේශීය | යෝගා කලාව පිළිබඳ දැනුම |
| කාර්යාල සේවක සේවය සඳහා ශක්‍යතා පුහුණු වැඩසටහන | 40 | 2023-09-19 | 19,690.00 | | දේශීය | කාර්යාල ක්‍රම පිළිබඳ දැනුම |
| තොරතුරු දැනගැනීමේ පනත පිළිබඳ පුහුණුව - දිස්ත්‍රික් සහ ප්‍රාදේශීය | 45 | 2023-10-31 | 25,539.00 | | දේශීය | තොරතුරු දැනගැනීමේ පනත පිළිබඳ දැනුම |
| ඵලදායීතා පුහුණුව - A කණ්ඩායම | 100 | 2023-10-27 | 10,360.00 | | දේශීය | ඵලදායීතාව පිළිබඳ දැනුම |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| ඵලදායිතා පුහුණුව - A කණ්ඩායම ii ශ්‍රේණිය | 85 | 2023-11-03 | 6,360.00 | | දේශීය | ඵලදායිතාව පිළිබඳ දැනුම |
| ඵලදායිතා පුහුණුව - ඊ කණ්ඩායම | 85 | 2023-11-21 | 7,670.00 | | දේශීය | ඵලදායිතාව පිළිබඳ දැනුම |
| සමීක්ෂණ මණ්ඩල පුහුණු වැඩසටහන | 65 | 2023-11-21 | 31,519.00 | | දේශීය | වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය පිළිබඳ දැනුම |
| ඵලදායිතා පුහුණුව - B කණ්ඩායම ii ශ්‍රේණිය | 90 | 2023-11-28 | 8,170.00 | | දේශීය | ඵලදායිතාව පිළිබඳ දැනුම |
| මානව සම්පත් සංවර්ධන සැලැස්ම | 40 | 2023-12-08 | 12,880.00 | | දේශීය | මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළිබඳ දැනුම |
| ඵලදායිතා සංකල්ප - සමෘද්ධි දෙපාර්තමේ-න්තු කාර්ය මණ්ඩලය | 115 | 2023-12-16 | 44,520.00 | | දේශීය | ඵලදායිතාව පිළිබඳ දැනුම |

## ආයතනයේ දැක්ම සහ පරමාදර්ශී දැක්ම

දිවයිනේ තිරසර සංවර්ධනය උදෙසා ප්‍රාදේශීය මට්ටමින් මහජනතාව වෙත කාර්යක්ෂම සේවාවක් සැපයීම, රාජ්‍ය ප්‍රතිපත්තීන්ට අනුකූල ලෙස කලින් කලට හිමිවන මානව සහ භෞතික සම්පත් කාර්යක්ෂම හා ඵලදායී ලෙස භාවිතා කරමින් මහජනතාවගේ මූලික අවශ්‍යතා සහ තිරසර ජීවන තත්වයන් ඉහළ නැංවීම යන අපගේ ආයතනයේ දැක්ම සහ පරමාදර්ශී දැක්ම සාක්ෂාත් කර ගැනීම සඳහා මෙම පුහුණු පාඨමාලාවන් බෙහෙවින්ම දායක වී ඇත.

**ඒ අනුව ඉහතින් දක්වා ඇති පුහුණු පාඨමාලා මඟින් පහත සඳහන් කර ඇති කරුණු අපගේ ආයතනයේ ඵලදායිතා වර්ධනයට දායක වී ඇත.**

1. රාජ්‍ය සම්පත් කාර්යක්ෂම සහ ඵලදායී ලෙසත් නිවැරදි ලෙසත් භාවිතා කරන කාර්යය මණ්ඩලයක් බිහි කිරීම.
2. යහපත් ආකල්පවලින් සමන්විත සහ කැපවීමෙන් යුක්තව ක්‍රියා කරන නිලධාරීන් නිර්මාණය වෙමින් පවතී.
3. පරිසර හිතකාමී ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීමේ සැලසුම් නිර්මාණය කෙරෙමින් පවතී.

4 වගවීම සහ විනිවිද භාවයෙන් යුක්තව සේවා සැලසීමට කැපවූ කාර්යය මණ්ඩලයක් බිහි වෙමින් පවතී.

5 අපක්ෂපාතී ලෙස සහ විනිවිද භාවයෙන් යුක්තව සේවා සැලසෙන බවට නිරීක්ෂණය වේ.

6 පහසුවෙන් සේවාවන් සලසා දිය හැකි ආකාරයට භෞතික වශයෙන් සහ මානව සම්පත් වශයෙන් කාර්යාලයේ තත්වය ඉහළ නැංවීමට හැකියාව ලැබී ඇත.

# 07 වන පරිච්ඡේදය

## අනුකූලතා වාර්තාව

| අංකය | අදාළ කර ගත යුතු අවශ්‍යතාව | අනුකූලතා තත්ත්වය (අනුකූල වේ / අනුකූල නොවේ) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීම සඳහා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග යෝජනා |
|---|---|---|---|---|
| 1 | **පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ / ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ** | | | |
| 1.1 | වාර්ෂික මූල්‍ය ප්‍රකාශ | අනුකූල වේ | | |
| 1.2 | රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම | අනුකූල වේ | | |
| 1.3 | ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම් (වාණිජ අත්තිකාරම් ගිණුම්) | - | | |
| 1.4 | ගබඩා අත්තිකාරම් ගිණුම් | - | | |
| 1.5 | විශේෂ අත්තිකාරම් ගිණුම් | - | | |
| 1.6 | වෙනත් | - | | |
| 2 | පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම (මු.රෙ. 445) | | | |
| 2.1 | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන යාම | අනුකූල වේ | | |
| 2.2 | පුද්ගල පඩිනඩි ලේඛන/ පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.3 | විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.4 | අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.5 | සියළුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙල කර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම | අනුකූල වේ | | |
| 2.6 | චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.7 | ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.8 | තොග ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.9 | හානි පාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.10 | බැරකම් ලේඛනය යාවත් කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.11 | උප පත්‍රිකා පොත් ලේඛන (GA - N20) යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 03 | **මූල්‍ය පාලනය සඳහා කාර්යයන් අභිනියෝජනය කිරීම (මු.රෙ. 135)** | | | |

| | | | | |
|---|---|---|---|---|
| 3.1 | ආයතනය තුළ මූල්‍ය බලතල පවරාදී තිබීම | අනුකූල වේ | | |
| 3.2 | මූල්‍ය බලතල පවරාදීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම | අනුකූල වේ | | |
| 3.3 | සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරාදී තිබීම | අනුකූල වේ | | |
| 3.4 | 2014-05-11 දිනැති අංක 171/2004 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව ගණකාධිකාරිවරුන් විසින් රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීම පිළිබඳව පාලනයන්ට අනුගත වීම | අනුකූල වේ | | |
| 4 | **වාර්ෂික සැලසුම් සකස් කිරීම** | | | |
| 4.1 | වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | | |
| 4.2 | වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | | |
| 4.3 | වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | | |
| 4.4 | වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD) නියමිත දිනට ඉදිරිපත් කිරීම | අනුකූල වේ | | |
| 4.5 | වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| 5 | **විගණන විමසුම්** | | | |
| 5.1 | විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට, සියළුම විගණන විමසුම් වලට පිළිතුරු ලබා දී තිබීම | අනුකූල වේ | | |
| 6 | **අභ්‍යන්තර විගණනය** | | | |
| 6.1 | මු.රෙ. 134 (2) DMA/ 1-2019 අනුව, වසර ආරම්භයේ දී විගණකාධිපතිවරයාගේ උපදෙස් සහිතව අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කර තිබීම | අනුකූල වේ | | |
| 6.2 | සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් ඇතුළත දී පිළිතුරු සපයා තිබීම | අනුකූල වේ | | |
| 6.3 | 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40 (4) උප වගන්තිය ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| 6.4 | මුදල් රෙගුලාසි 134 (3) ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තබීම | අනුකූල වේ | | |
| 7 | විගණන හා කළමනාකරණ කමිටු | | | |
| 7.1 | කළමනාකරණ විගණන දෙපාර්තමේන්තු චක්‍රලේඛ අංක 1-2019 අනුව, අදාළ වර්ෂය තුළ අවම | අනුකූල වේ | | |

| | | | | |
|---|---|---|---|---|
| | වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04 ක් වත් පවත්වාගෙන තිබීම | | | |
| 8 | වත්කම් මිල දී ගැනීම හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම | | | |
| 8.1 | ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව, එම චක්‍රලේඛයේ විධිවිධාන ක්‍රියාත්මක කිරිම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත් කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තා කර තිබීම | අනුකූල වේ | | |
| 8.2 | රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| 8.3 | වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයේදී අනාවරණය වූ අතිරික්ත, ඌණතා හා වෙනත් නිර්දේශ පිළිබඳව චක්‍රලේඛයේ සඳහන් කාල සීමාව තුළ කටයුතු සිදුකොට තිබීම | අනුකූල වේ | | |
| 8.4 | මු.රෙ. 772 අනුව ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම සිදුකිරීම | අනුකූල වේ | | |
| 8.5 | **වාහන කළමනාකරණය** | අනුකූල වේ | | |
| 9 | වත්කම් මිල දී ගැනීම හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම | | | |
| 9.1 | සංචිත වාහනය සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කිරීම | අනුකූල වේ | | |
| 9.2 | වාහන ගර්හිත වී මාස 06 කට වඩා අඩු කාලයක දී ඒවා අපහරණය කර තිබීම | - | | |
| 9.3 | වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීන කර පවත්වා ගෙන යාම | අනුකූල වේ | | |
| 9.4 | සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ.103,104,109 හා 110 ප්‍රකාරව කටයුතු කිරීම | අනුකූල වේ | | |
| 9.5 | 2016-12-29 දිනැති අංක 30/2016 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව, වාහන වල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම | අනුකූල වේ | | |

| | | | | |
|---|---|---|---|---|
| 9.6 | කල් බදු කාල සීමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත් වල සම්පූර්ණ අයිතිය පවරා ගෙන තිබීම | අනුකූල වේ | | |
| 10 | **බැංකු ගිණුම් කළමනාකරණය** | | | |
| 10.1 | නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙළ කර, සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| 10.2 | සමාලෝචිත වර්ෂයේ දී හෝ ඊට පෙර වර්ෂ වල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රිය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම | අනුකූල වේ | | |
| 10.3 | බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම | අනුකූල වේ | | |
| 11 | **ප්‍රතිපාදන උපයෝජනය** | | | |
| 11.1 | සලසා තිබූ ප්‍රතිපාදන සීමාවන් ඉක්මවා නොයන පරිදි ඒවාට අදාල වියදම් දැරීම | අනුකූල වේ | | |
| 11.2 | මු.රෙ. 94 (1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේ දී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්ම වන පරිදි බැරකම්වලට එළැඹීම | අනුකූල වේ | | |
| 12 | **රජයේ නිලධාරින්ගේ අත්තිකාරම් ගිණුම්** | | | |
| 12.1 | සීමාවන්වලට අනුකූල වීම | අනුකූල වේ | | |
| 12.2 | හිඟ හිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදු කර තිබීම | අනුකූල වේ | | |
| 12.3 | වසර එකක වැඩි කාලයක් හිඟ පවතින ණය පියවීම | අනුකූල වේ | | |
| 13 | **පොදු තැන්පත් ගිණුම** | | | |
| 13.1 | කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ. 571 ප්‍රකාරව කටයුතු කර තිබීම | අනුකූල වේ | | |
| 13.2 | පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 14 | **අග්‍රිම ගිණුම** | | | |
| 14.1 | සමාලෝචිත වර්ෂය අවසානයේ දී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම | අනුකූල වේ | | |
| 14.2 | මු.රෙ.371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම, එම කාර්යය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම | අනුකූල වේ | | |
| 14.3 | මු.රෙ.371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර කිරීම | අනුකූල වේ | | |
| 14.4 | අග්‍රිම ගිණුමේ ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම | අනුකූල වේ | | |

| | | | | |
|---|---|---|---|---|
| 15 | **ආදායම් ගිණුම්** | | | |
| 15.1 | රැස් කළ ආදායමෙන් අදාළ රෙගුලාසිවලට අනුකූලව ආපසු ගෙවීම් සිදුකොට තිබීම | අනුකූල වේ | | |
| 15.2 | රැස් කර තිබූ ආදායම්, තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායම් ගිණුමට බැර කර තිබීම | අනුකූල වේ | | |
| 15.3 | මු.රෙ. 176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| 16 | **මානව සම්පත් කළමනාකරණය** | | | |
| 16.1 | අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 16.2 | කාර්ය මණ්ඩලයේ සියළුම සාමාජිකයන් වෙත රාජකාරි ලැයිස්තු ලිඛිතව ලබාදී තිබීම | අනුකූල වේ | | |
| 16.3 | 20-09-2017 දිනැති කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියලුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| 17 | **මහජනයා වෙත තොරතුරු ලබා දීම** | | | |
| 17.1 | තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත් කොට තොරතුරු ලබා දීමේ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 17.2 | ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර, වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා / චෝදනා පල කිරීමට පහසුකම් සලසා තිබීම | අනුකූල වේ | | |
| 17.3 | තොරතුරු දැනගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| 18 | **පුරවැසි ප්‍රඥාප්තිය ක්‍රියාත්මක කිරීම** | | | |
| 18.1 | අංක 05/2018 සහ අංක 05/2018 (1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි සේවාලාභී ප්‍රඥාප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම | අනුකූල වේ | | |
| 18.2 | එම චක්‍රලේඛයේ 2.3 ඡේදයේ පරිදි, පුරවැසි සේවාලාභී ප්‍රඥාප්තියක් සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතනය විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම | අනුකූල වේ | | |
| 19 | **මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම** | | | |

| | | | | |
|---|---|---|---|---|
| 19.1 | 2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන අංක 02/2018 හි ඇමුණුම 02 හි සඳහන් ආකෘතිය පදනම් කර ගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම | අනුකූල වේ | | |
| 19.2 | කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නොඅඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම | අනුකූල වේ | | |
| 19.3 | ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කර ගෙන සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබීම | අනුකූල වේ | | |
| 19.4 | ඉහත චක්‍රලේඛයේ අංක 6.5 ඡේදයේ ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙල කිරීම, ධාරිතා සංවර්ධනය වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සහ නිපුණතා සංවර්ධන වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත් කොට තිබීම | අනුකූල වේ | | |
| 20 | **විගණන ඡේද වලට ප්‍රතිචාර දැක්වීම** | | | |
| 20.1 | ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කළ විගණන ඡේද මඟින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම | අනුකූල වේ | | |

<u>අවසන්</u>